ISSN 1391 - 4006

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT




# 2020

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
## NATIONAL LIBRARY & DOCUMENTATION SERVICES BOARD

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

# 2020

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

**தேசிய நூலக ஆவணவாக்கள் சேவைகள் சபை**

**National Library and Documentation Services Board**

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்சு

**Ministry of Education**

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2020

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
**தேசிய நூலக ஆவணவாக்கள் சேவைகள் சபை**
**National Library and Documentation Services Board**

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

**ප්‍රකාශනය**

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L


14, නිදහස් මාවත, කොළඹ 07
14th, Independence Avenue, Colombo 07
இல.14. சுதந்திர வழி, கொழும்பு 07

# වාර්ෂික වාර්තාව

# 2020

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවිඩය | ix |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | xi |
| දැක්ම / මෙහෙවර | 1 |
| අරමුණු හා පරමාර්ථ | 1 |
| ආයතනික දර්ශනය | 2 |
| කාර්ය මණ්ඩල තොරතුරු | 4 |
| කාර්ය මණ්ඩල පුහුණුවීම් | 7 |
| ප්‍රතිග්‍රහණ අංශය | 8 |
| පාඨක සේවා අංශය | 12 |
| තොරතුරු තාක්ෂණ අංශය | 14 |
| ග්‍රන්ථ විඥාපන පාලන අංශය | 16 |
| සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය | 18 |
| පුස්තකාල පර්යේෂණ අංශය | 22 |
| ඩිජිටල් පුස්තකාල ඒකකය | 24 |
| ව්‍යාප්ති සේවා අංශය | 25 |
| අධ්‍යාපන හා පුහුණු අංශය | 29 |
| ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය | 32 |
| පුස්තකාල සහයෝගිතා අංශය | 39 |
| ක්‍රමෝපාය සැලසුම් අංශය | 43 |
| පරිපාලන අංශය | 44 |
| නඩත්තු අංශය | 45 |
| මුදල් අංශය | 46 |
| අභ්‍යන්තර විගණන අංශය | 47 |
| ගිණුම් වාර්තාව 2020 | 49 |
| විගණකාධිපති වාර්තාව 2020 | 69 |

## සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 වසරේ කරන ලද කාර්යයන්හි ප්‍රගතිය අංශ අනුපිළිවෙළින් මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර තිබේ. රජයේ භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදනවලින් හා වෙනත් මාර්ගවලින් ලැබෙන ඉපයීම් යොදා ගනිමින් මණ්ඩලයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර තිබේ. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් ලබා දුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් ද කෘතවේදී ව සිහිපත් කරමි. මෙම කාර්යභාරය ඉටු කිරීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටත්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සියලු ම නිලධාරින්ටත් මෙය සම්පාදනය කළ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීත්වය පළකර සිටිමි.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාමත් මෙරට සෙසු පුස්තකාලවල අභිවෘද්ධිය සඳහා කටයුතු කිරීමත් වේ. මෙම වසරේ ලොව පුරා ශීඝ්‍ර ලෙස ව්‍යා-ප්ත වූ ඣධඵෂ 19 වසංගත රෝග තත්වය හේතුවෙන් වසරේ දීර්ඝ කාලයක් ආයතනය වසා තැබීමත්, කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු පිරිසක් මෙම රෝග යට ගොදුරු වීමත් නිසා කාර්යයන්වල ඵලදායකත්වයට බලපෑමක් විය. කෙසේ වුව ද 2020 වසර තුළ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබේ. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික ආයතන හා සංවිධාන සමග කටයුතු කිරීම යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය එක්ව ධසෙජ 365 මෘදුකාංගය ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල වෙත හඳුන්වා දීමට පියවර ගෙන තිබේ. පරිගණක සූචිකරණ කටයුතුවල ඒකමිතියක් ඇති කිරීමේ අරමුණෙන් ඒඍක 21 ආකෘතිය ඇසුරෙන් පරිගණක සූචිකරණයට අදාළ පොදු ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කර තිබේ. මහාවංශය පුස්කොළ පොත ඓතිහාසික ලේඛනයක් ලෙස සලකා නාමයෝජනා පත්‍රයක් සකස් කොට යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇති අතර දුම්බර රටා කළාල සම්ප්‍රදාය ලෝක අස්පර්ෂණීය උරුම ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. පාසල් දරු දැරියන් අතර පොතපත කියවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් බසයෙන් අනාගතයට බස්රථ පුස්තකාල වැඩසටහන හා රටක් වටින පොතක්, පොත් 10,000ක් ලිවීමේ ජාතික වැඩසටහන හඳුන්වා දෙන ලදී. මීට අමතරව විවිධ ව්‍යාපෘති ගණනාවක් මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් හා අවශ්‍ය මගපෙන්වීම ලබා දුන් මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, උපදේශක කමිටුවල සාමාජික මහත්ම මහත්මීන්ටත් මෙම වාර්තාව සම්පාදනය කළ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීත්වය පළකර සිටිමි.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# වාර්ෂික වාර්තාව - 2020



## දැක්ම :

සමස්ත ජනතාවට පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවේශයක් සපයන ජාතික ඥාන කේන්ද්‍රය බවට පත්වීම.

## මෙහෙවර :

දැනුවත් සමාජයක් බිහි කිරීම උදෙසා ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම, ජාතික පුස්තකාල හා විඥාපන සේවා පද්ධතිය සංවර්ධනය, පුස්තකාල සේවා කාර්යක්ෂමතාව පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතයට දිරිදීම, ග්‍රන්ථ විඥාපන පහසුකම් සැපයීම සහ ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අනුග්‍රහ දැක්වීම.

## අරමුණු හා පරමාර්ථ :

- ශ්‍රී ලංකාවේ පුස්තකාල, තොරතුරු හා තදනුබද්ධ සියලුම සේවා සඳහා නායකත්වය සැපයීම.
- රටතුළ හෝ ඉන් බැහැර ව ලිඛිත, මුද්‍රිත හෝ අන්‍යාකාරයෙන් ප්‍රකාශිත පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ පරිපූර්ණ ජාතික සංචිතයක් පිහිටුවීම.
- ග්‍රන්ථ විඥාපන, ප්‍රලේඛන සේවා සංස්ථාපනය හා පවත්වාගෙන යාම.
- පුස්තකාල හා තොරතුරු සේවා සම්බන්ධ අධ්‍යාපන පුහුණු හා වෘත්තීය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම හා ප්‍රමිති සම්පාදනය.
- දේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මානව සම්පත් සංවිධානය හා භෞතික සම්පත් ප්‍රවර්ධනය.
- දේශීය ග්‍රන්ථ ප්‍රකාශනයට දිරි දීම සහ කියවීම ප්‍රවර්ධනය.
- පුස්තකාල හා තොරතුරු සේවාවන්හි තොරතුරු තාක්ෂණය භාවිතය දිරිමත් කිරීම.
- පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් පවත්නා ආයතන හා සංවිධාන සමග සහයෝගීතා වර්ධනය.
- විවිධ ජන කොටස්වල සංස්කෘතික අනන්‍යතාවලට ගරු කරමින් අන්‍යෝන්‍ය සහජීවනය තහවුරු කෙරෙන පරිදි පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානය කිරීම.
- ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය සම්පත්, සේවා සංවිධානය හා සැපයීම.

(1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 25වන වගන්තිය ප්‍රකාර සැකසුණි)

## ආයතනික දර්ශනය

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම.

(ආ) ජාතික මට්ටමේ පුස්තකාල සේවා හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන් ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම, පුස්තකාල වැඩිදියුණු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල සම්පත් ලබාදීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල ආරම්භ කිරීම සඳහා සහයෝගය ලබා දීම, පොත්පත් සංරක්ෂණය සඳහා පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, පළාත් සභා මට්ටමින් පුස්තකාල නගා සිටුවීම සඳහා පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමග කටයුතු කිරීම. විවිධ ව්‍යසනවලින් හානි වූ පුස්තකාල සංවර්ධනය, පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම, පුස්තකාල සහයෝගිතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම, ජාතික පුස්තකාලයේ තොරතුරු ඩිජිටල්කරණය කිරීම හා එම තොරතුරු ඇසුරින් ජාතික ඩිජිටල් පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 3 වැනි වගන්තිය (ආ) ප්‍රකාර ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය 2020.12.31 දින වන විට පහත සඳහන් පරිදි විය.

01. සොනාල ගුණවර්ධන මහතා - සභාපති (2020 ජනවාරි මස 01 සිට)

## සාමාජිකයන් - නිල බලයෙන්

02. එන්.එච්. එම්. චිත්‍රානන්ද මහතා - (2020 ජනවාරි මස සිට පෙබරවාරි මස දක්වා), ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්. එම්. එම්. රත්නායක මහතා - අතිරේක ලේකම් (2020 ජුනි මස), එල්. එම්. ඩී. ධර්මසේන මහතා - අතිරේක ලේකම් (2020 ජූලි මස සිට) (අධ්‍යාපන අමාත්‍යාංශය), ලේකම් වෙනුවට

03. එන්. යූ. එන්. මෙන්ඩිස් මහතා - අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය) (2020 ජනවාරි මස සිට)

04. අනෝජා පී. ගුරුගේ මහත්මිය .- අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය) (2020 ජනවාරි මස සිට)

05. ආචාර්ය එන්. ඩී. විජයසුන්දර මහත්මිය - සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (2020 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා), ආචාර්ය රුවන් ගමගේ මහතා - සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (2020 සැප්තැම්බර් මස සිට)

06. මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා .- සභාපති (ජාතික විද්‍යා පදනම) (2020 ජූලි මස සිට)

07. ඩී. එච්. ආර්. ඩී. විජේසිංහ මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් අමාත්‍යාංශය) (2020 ජනවාරි මස සිට)

08. මහින්ද බී. හේරත් මහතා - ප්‍රධාන විධායක නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය) (2020 ජනවාරි මස සිට)

## අනෙකුත් සාමාජිකයින්

09. ආචාර්ය ඒ. ඩබ්. ඒ. ප්‍රියංවදා ලක්මාලි වනිගසූරිය මහත්මිය (2020 පෙබරවාරි මස සිට)

10. මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය (2020 ජනවාරි මස සිට)

11. ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ මහතා (2020 ජනවාරි මස සිට)

12. රාමසාමි සිවරාජා මහතා (2020 ජනවාරි මස සිට)

13. එච්. ඩී. ප්‍රේමසිරි මහතා (2020 පෙබරවාරි මස සිට)

14. මහාචාර්ය ගාමිණී සමරණායක මහතා (2020 පෙබරවාරි මස සිට)

2020 වර්ෂය තුළ මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා තිබේ. රටේ පැවැති COVID - 19 වසංගත රෝග තත්වය හේතුවෙන් සංචරණ සීමා හා නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම මත සෙසු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.

## උපදේශක කමිටු රැස්වීම් පැවැත්වීම

ආයතනයේ ඒ ඒ අංශවලින් ඉටුකරනු ලබන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා පත්කරන ලද උපදේශක කමිටු මෙම වසර තුළ දී පහත සඳහන් පරිදි රැස්වී තිබේ.

| උපදේශක කමිටුව | අංශය | රැස්වීම් පැවත් වූ දිනය |
|---|---|---|
| ජාතික පුස්තකාල උපදේශක කමිටුව | පාඨක සේවා හා ප්‍රතිග්‍රහණ අංශ | 2020.06.25, 2020.08.17, 2020.12.22 |
| ග්‍රන්ථ විඥාපන පාලන උපදේශක කමිටුව | ග්‍රන්ථ විඥාපන පාලන අංශය | 2020.02.25 |
| පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ අනු කමිටුව | පුස්තකාල සහයෝගිතා අංශය | 2020.07.21 |

| | | |
|---|---|---|
| අධ්‍යාපන හා පුහුණු, සහයෝගිතා වැඩසටහන් පිළිබඳ උපදේශක කමිටුව | අධ්‍යාපන හා පුහුණු සහ පුස්තකාල සහයෝගිතා අංශ | 2020.09.08 |
| ප්‍රකාශන උපදේශක කමිටුව | ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය | 2020.02.12, 2020.02.26, 2020.08.12, 2020.09.09, 2020.12.31 |
| මුද්‍රණ උපදේශක කමිටුව | | 2020.03.12, 2020.06.30, 2020.09.22, 2020.10.09 |
| නව ප්‍රකාශන මිල දී ගැනීමේ උපදේශක කමිටුව | | 2020.11.20, 2020.12.07 |
| ළමා හා යොවුන් සාහිත්‍ය උපදේශක කමිටුව | ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය | 2020.03.12, 2020.09.22, 2020.10.09 |
| පුස්තකාල පර්යේෂණ උපදේශක කමිටුව | පුස්තකාල පර්යේෂණ අංශය | 2020.02.27, 2020.08.27 |
| විගණන හා කළමනාකරණ කමිටුව | අභ්‍යන්තර විගණන අංශය | 2020.07.13, 2020.12.04 |

## කාර්ය මණ්ඩල තොරතුරු

| සේවයෙන් ඉවත්වීම් | | |
|---|---|---|
| **නම** | **තනතුර** | **දිනය** |
| එච්. ඩබ්ලිව්. කේ. එස්. පුෂ්පකාන්ති මහත්මිය | සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය | 2020.03.31 |
| වාසනා එල්ලාවල මහත්මිය | අභ්‍යන්තර විගණක ii ශ්‍රේණිය | 2020.05.29 |
| එච්. ඩී. ඩී. ද සිල්වා මහත්මිය | තොරතුරු සහකාර iii ශ්‍රේණිය | 2020.02.28 |
| කේ. එස්. එස්. ගුණසිංහ මහත්මිය | | 2020.06.30 |
| සී. එස්. කන්නන්ගර මහතා | කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය | 2020.08.25 |
| එම්. ඒ. එස්. මදුරප්පෙරුම මහත්මිය | | 2020.09.11 |
| **විශ්‍රාම ගැනීම්** | | |
| ඊ. පී. සුමතිපාල මහතා | තොරතුරු සහකාර i ශ්‍රේණිය | 2020.04.01 |
| **තනතුරු උසස්වීම්** | | |
| ඒ. වී. එස්. ඩී. සුබසිංහ මහත්මිය | කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය | 2020.11.02 |
| **ශ්‍රේණි උසස්වීම්** | | |
| එම්. ඊ. සී. ඩී. ඊ. සෙනෙවිරත්න මහතා | තොරතුරු සහකාර i ශ්‍රේණිය | 2020.04.01 |
| පී. ඩී. බී. එස්. පෙරේරා මහතා | | |
| ඩී. ඩී. සුමනසිරි මහතා | | |

<table>
<tr><td>එල්. ටී. යූ. විතානගේ මහත්මිය</td><td rowspan="5">තොරතුරු සහකාර i ශ්‍රේණිය</td><td rowspan="3">2020.04.01</td></tr>
<tr><td>ජී. අයි. එන්. ද සිල්වා මහතා</td></tr>
<tr><td>ආර්. කේ. ඒ. ඩී. එම්. වී. රත්නසේකර මෙනවිය</td></tr>
<tr><td>එස්. යූ. විජේතිලක මහත්මිය</td><td>2018.05.02</td></tr>
<tr><td>එම්. ටී. එස්. සෆායා මහත්මිය</td><td>2020.02.09</td></tr>
<tr><td>පී. ආර්. වයි. එම්. ප්‍රියානි මෙනවිය</td><td rowspan="3">කළමනාකරණ සහකාර i ශ්‍රේණිය</td><td>2018.06.01</td></tr>
<tr><td>එල්. එච්. ටී. රංගිකා මහත්මිය</td><td>2018.10.26</td></tr>
<tr><td>කේ. කේ. එස්. ද සිල්වා මහත්මිය</td><td>2019.01.04</td></tr>
<tr><td>එම්. පී. ලීලාවතී මහත්මිය</td><td rowspan="5">පුස්තකාල සහායක i ශ්‍රේණිය</td><td>2013.05.01</td></tr>
<tr><td>ඩී. ඒ. පී. සුසන්ත මහතා</td><td>2019.12.31</td></tr>
<tr><td>කේ. එච්. එම්. නිලන්ත මහතා</td><td>2016.08.15</td></tr>
<tr><td>කේ. ජී. සමන් චන්දන මහතා</td><td>2018.03.02</td></tr>
<tr><td>ඒ. කේ. කුසුමාවතී මහත්මිය</td><td>2016.12.16</td></tr>
<tr><td>ඩී. එස්. පතිරණ මහතා</td><td>රියදුරු i ශ්‍රේණිය</td><td>2017.09.23</td></tr>
</table>

2020.12.31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

| **තනතුර** | **සේවයේ යෙදී සිටි සංඛ්‍යාව** | **පුරප්පාඩු** |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | -- |
| අධ්‍යක්ෂ (මුදල් හා පාලන) | 01 | -- |
| අධ්‍යක්ෂ (වෘත්තීය) | 02 | -- |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 01 | -- |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෘත්තීය) | -- | 03 |
| සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 01 | -- |
| සහකාර අධ්‍යක්ෂ | 08 | 01 |
| සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 01 | -- |
| සහකාර අධ්‍යක්ෂ (සංරක්ෂණ) | 01 | -- |
| අභ්‍යන්තර විගණක | -- | 01 |
| ප්‍රකාශන නිලධාරී | 01 | -- |
| පාලන ලේකම් | -- | 01 |
| පරිපාලන නිලධාරී | 01 | -- |

| | | |
|---|---|---|
| සංරක්ෂණ නිලධාරී | -- | 01 |
| පර්යේෂණ නිලධාරී | 01 | -- |
| ව්‍යාප්ති නිලධාරී | -- | 01 |
| අලෙවි ප්‍රවර්ධන නිලධාරී | 01 | -- |
| පුහුණු කිරීමේ නිලධාරී | 01 | -- |
| පද්ධති විශ්ලේෂක | -- | 01 |
| පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී | 03 | 06 |
| නඩත්තු නිලධාරී | 01 | -- |
| ගිණුම් නිලධාරී | -- | 01 |
| පුස්තකාල සංවර්ධන සහකාර | 03 | 09 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 01 | -- |
| තොරතුරු සහකාර | 42 | 08 |
| ලේඛන සංරක්ෂක | 01 | 01 |
| කළමනාකරණ සහකාර | 28 | 08 |
| රියදුරු | 05 | 01 |
| විදුලි කාර්මික | 01 | -- |
| පොත් බැඳුම්කරු | 04 | 02 |
| පුස්තකාල සහායක | 13 | 03 |
| කාර්යාල සහායක | 19 | 07 |
| **එකතුව** | **142** | **55** |

## කාර්ය මණ්ඩල පුහුණුවීම්

### දේශීය පුහුණුවීම් - (කෙටිකාලීන)

| පුහුණු වැඩසටහන් | සහභාගි වූ නිලධාරීන් | ස්ථානය | දිනය | වියදම (රු.) |
|---|---|---|---|---|
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා | ජා.පු. හා ප්‍ර.සේ.ම. | 2020.01.29 | 27,840.00 |

### දේශීය පාඨමාලා (දිගුකාලීන)

| පාඨමාලාවේ නම | නිලධාරියාගේ නම | ස්ථානය | කාලය | පාඨමාලා ගාස්තු (රු.) |
|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | අයි. එම්. විජේසුන්දර මහත්මිය (පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී) | කැලණිය විශ්වවිද්‍යාලය | වසරකි | 50,000.00 |

### විදේශීය පුහුණු වැඩසටහන්

| වැඩසටහන | නිලධාරියාගේ නම | රට | කාලය |
|---|---|---|---|
| නැගී එන පුස්තකාල නවෝත්පාදකයින්ගේ ජාල සහ දකුණු ආසියානු ගෝලීය පුස්තකාල නායකත්ව ධාරිතා සංවර්ධන වැඩසටහන | එච්. ඩබ්ලිව්. කේ. එස්. පුෂ්පකාන්ති මහත්මිය, (සහකාර අධ්‍යක්ෂ ii) | ඉන්දියාව | 2020.02.06 සිට 2020.02.13 දක්වා |

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ විවිධ අංශවල කාර්යභාරය හා ප්‍රගතිය

## ප්‍රතිග්‍රහණ අංශය

ප්‍රතිග්‍රහණ අංශයේ වගකීම හා කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සුදුසු පොත්පත්, විද්‍යුත් මාධ්‍ය මූලාශ්‍ර සහ වෙනත් වර්ගවල තොරතුරු මූලාශ්‍ර අත්පත් කර ගැනීමයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අනුව (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන, (ii) ශ්‍රී ලංකාව පිළිබඳ විදේශ රටවල පළවන ප්‍රකාශන, (iii) ශ්‍රී ලාංකිකයින් විසින් විදේශ රටවල පළ කරන ප්‍රකාශන (iv) ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ (v) වෙනත් පුස්තකාලවලට ලබාගත නො හැකි එහෙත් පර්යේෂණ සඳහා අත්‍යවශ්‍ය විමර්ශන මූලාශ්‍ර සහ (vi) පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන ලබාගැනීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ. මීට අමතරව ISBN, ISSN හා ISMN අංක ලබාදෙන ප්‍රකාශන තැන්පතු පිටපත් සේ ලබා ගැනෙයි. ඉහත (i), (ii), (iii) සහ (vi) වර්ගවලට අයත් ප්‍රකාශනවලින් පිටපත් දෙක (02) බැගින් ද, විමර්ශන ග්‍රන්ථවලින් එක් පිටපතක් බැගින් ද ලබාගැනීමට කටයුතු කෙරේ. විමර්ශන ග්‍රන්ථ ලබා ගැනීමේ දී ඒවායේ නව සංස්කරණ කාලානුරූපව මිල දී ගනු ලැබේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කිරීමේ දී ප්‍රධාන ක්‍රම 04ක් අනුගමනය කරනු ලැබේ.

(i) නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම

(ii) මිල දී ගැනීම්

(iii) පරිත්‍යාග

(iv) හුවමාරු සේවා ක්‍රම (Exchange Services) යටතේ ප්‍රකාශන ලබාගැනීම

### නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම

1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතේ 1976 වසරේ සංශෝධනයට අනුව ශ්‍රී ලංකාවේ පළවන සෑම ප්‍රකාශනයක ම පිටපතක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුවට නීත්‍යානුකූලව හිමි වේ. ශ්‍රී ලංකාවේ මෙම නීතිය ක්‍රියාත්මක කරන ආයතනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වේ. මුද්‍රණකරුවන් විසින් එහි තැන්පත් කරනු ලබන පිටපත්වලින් එක් පිටපතක් ජාතික පුස්තකාලය වෙත ලබා දීම සිදු වේ. ඒ අනුව මෙම වසර තුළ දී තැන්පතු ක්‍රමය යටතේ ජාතික පුස්තකාලය වෙත අත්පත්කරගත් ප්‍රකාශන පහත පරිදි වේ.

| ප්‍රකාශන වර්ගය | අත්පත් කර ගත් ප්‍රමාණය |
|---|---|
| පොත් | 2266 |
| වාර සඟරා | 201 |
| ගැසට් | 1482 |
| පොලිස් ගැසට් | 19 |
| පනත් | 54 |
| පනත් කෙටුම්පත් | 72 |

| | |
|---|---|
| හැන්සාඩ් | 22 |
| දුම්රිය නිවේදන | 7 |
| දෙසති නවේදන | 7 |
| මුද්දර නිවේදන | 11 |
| පුවත් හසුන් | 264 |
| බ්‍රේල් ප්‍රකාශන | 14 |
| නාමාවලි/අනුක්‍රමණිකා | 6 |
| දිනපතා/සතිපතා පුවත්පත් | 12134 |
| ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ පුවත්පත් | 561 |

## මිල දී ගැනීම්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අවශ්‍ය තොරතුරු හා ප්‍රකාශන අත්පත් කර ගන්නා එක් ප්‍රධාන මාර්ගයක් වන්නේ මිල දී ගැනීමේ ක්‍රමයයි. දේශීය ප්‍රකාශන අතරින් තැන්පතු ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට නොලැබෙන ප්‍රකාශන, තැන්පතු ක්‍රමය යටතේ ලැබෙන ප්‍රකාශනවල අමතර පිටපත් ද මිල දී ගනු ලබයි. එසේ ම විදේශීය ප්‍රකාශන හා මූලික විමර්ශන ග්‍රන්ථ මිල දී ගැනීමේ දී දේශීය හා විදේශීය ග්‍රන්ථ නාමාවලී, පොත් ලැයිස්තු, පුවත්පත්, වාර සඟරා, අන්තර්ජාලය වැනි විවිධ මූලාශ්‍ර උපයෝගී කර ගනී. මිල දී ගැනීම් යටතේ 2020 වර්ෂය තුළ දී පුස්තකාල තොරතුරු මූලාශ්‍ර 693ක් මිල දී ගැනීම වෙනුවෙන් රු.524,283.00 ක මුදලක් වැය කර තිබේ. COVID - 19 වසංගත රෝගයේ බලපෑම මත දීර්ඝ කාලයක් නිරෝධායන ඇඳිරිනීතිය සහ රට වසා තැබීම හේතුවෙන් මිල දී ගැනීම් කටයුතුවල යම් පසුබෑමක් සිදු වී තිබේ.

**මෙම වර්ෂය තුළ දී මිල දී ගත් ප්‍රකාශන.**

| ප්‍රකාශන වර්ගය | ලබාගත් සංඛ්‍යාව |
|---|---|
| පොත් | 681 |
| පශ්චාද් උපාධි නිබන්ධන | 03 |
| දේශීය හා විදේශීය වාර සඟරා | 09 |
| **මුළු ප්‍රකාශන සංඛ්‍යාව** | **693** |

## පරිත්‍යාග

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුව වර්ධනය කර ගැනීම පිණිස පුද්ගලයන් සහ විවිධ ආයතනවලින් ලැබෙන පරිත්‍යාග බෙහෙවින් ඉවහල් වේ. පරිත්‍යාග වශයෙන් 2020 වසරේ දී දේශීය හා විදේශීය වශයෙන් විවිධ පරිත්‍යාගශීලීන්ගෙන් සහ ආයතනවලින් ප්‍රකාශන අත්පත් කර ගැනීම සිදු කර තිබේ. එම තොරතුරු පහත පරිදි වේ.

| පරිත්‍යාගය | පොත් ප්‍රමාණය | වාර සඟරා ප්‍රමාණය |
|---|---|---|
| මහාචාර්ය හෙන්රි වීරසිංහ එකතුව | 268 | - |
| මහාචාර්ය මයිකල් රොබර්ට්ස් එකතුව | 700 | - |
| ඊ. ටී. කන්නන්ගර එකතුව | 132 | - |
| නීතිඥ එස්. තලේසිංහම් එකතුව | 20 | - |
| ISBN තැන්පතු පිටපත් | 1349 | - |
| ISSN තැන්පතු පිටපත් | - | 43 |
| වෙනත් පරිත්‍යාග | 71 | 163 |

## හුවමාරු සේවා

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ප්‍රකාශන අත්පත් කර ගන්නා තවත් ක්‍රමයක් වන්නේ හුවමාරු සේවා (Exchange Services) ක්‍රමයයි. මේ යටතේ දේශීය හා විදේශීය ආයතන සමඟ ගිවිසුම්ගත වී තිබෙන අතර මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන එම ආයතනවලටත්, එම අයතනවල ප්‍රකාශන ජාතික පුස්තකාලය වෙත ලබා ගැනීමත් සිදු වේ. මෙම වසරේ විදේශීය හුවමාරු සේවාව යටතේ පොත් 19ක්, වාර සඟරා 50ක් සහ සංයුක්ත තැටි 01ක් ප්‍රතිග්‍රහණය කර තිබේ.

## ජාතික පුස්තකාලයට ලබා ගන්නා ප්‍රකාශන අතර මිල සඳහන් නොවූ ප්‍රකාශනවල මිල තීරණය කිරීමට අදාළ පොදු මිල ප්‍රතිපත්තියක් සකස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත අත්පත් කර ගනු ලබන මිල සඳහන් නොවූ ප්‍රකාශනවල මිල තීරණය කිරීම සඳහා වන පොදු ප්‍රතිපත්තියේ සම්පාදන කටයුතු අවසන් කර තිබේ. කෙසේ වුව ද මෙම ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් මෙරට සියලුම පුස්තකාලවලට බලපාන පරිදි සකස් කිරීමට ද පියවර ගෙන තිබේ.

## Koha පුස්තකාල මෘදුකාංගය මඟින් ප්‍රතිග්‍රහණ කටයුතු සිදු කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සූචිකරණ කටයුතු සඳහා Koha පුස්තකාල මෘදුකාංගය භාවිත කරනු ලැබේ. මෙම වර්ෂය තුළ Koha පරිගණක මෘදුකාංගය භාවිතයෙන් පරිගණක සූචිය සඳහා ප්‍රකාශන 10,194ක තොරතුරු ඇතුළත් කර තිබේ.

## ප්‍රතිග්‍රහණ කටයුතු සඳහා RFID-Tag ක්‍රමය භාවිතයට ගැනීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පොතපත ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් මෙන් ම සංගණන කටයුතු පහසු කර ගැනීම සඳහා RFID -Tag ක්‍රමය හඳුන්වා දී තිබේ. මෙම ක්‍රමවේදය සම්පූර්ණ වීම සඳහා ජාතික පුස්තකාලයේ පිවිසුම් හා පිටවීමේ දොරටුව සඳහා විද්‍යුත් ගේට්ටු (e - gates) ක්‍රමය ද ස්ථාපිත විය යුතු වේ. ශ්‍රී ලංකාවේ මෙන් ම ලොව ප්‍රමුඛ පෙළේ පුස්තකාලවල මෙමක්‍රමය භාවිතයට ගැනේ. ප්‍රතිග්‍රහණ කටයුතු සඳහා RFID -Tag ක්‍රමය භාවිතයට ගැනීම පසුගිය වසරේදී ආරම්භ කළ අතර මෙම වර්ෂය තුළ ප්‍රකාශන 8723ක් සඳහා RFID -Tag ඇතුළත් කර තිබේ.

## ජාතික පුස්තකාලය සඳහා එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම

ජාතික පුස්තකාලය සඳහා වූ එකතු සංවර්ධන ප්‍රතිපත්තිය (සිංහල භාෂාවෙන්) සකසා ජාතික පුස්තකාල නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ. එහි දෙමළ හා ඉංග්‍රීසි භාෂා පරිවර්තන කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

## පරිග්‍රහණ ලේඛන සම්පාදනය කිරීම

ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු Koha දත්ත පදනම ඇසුරින් ලබා ගැනීමට උපයෝගී වන පරිග්‍රහණ ලේඛන 2018 වසරේ ජනවාරි මස සිට 2020 වසරේ ජුනි මස දක්වා සම්පාදන කටයුතු නිම කොට තිබේ.

# පාඨක සේවා අංශය

ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති පොත්පත් සහ අනෙකුත් තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කිරීමට පාඨකයින්ට අවස්ථාව සලසා දීම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු මධ්‍යයේ වුව ද පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය මඟින් වැඩි පාඨක පිරිසකට සේවය සපයා තිබේ. මෙම වසර තුළ ජාතික පුස්තකාල එකතුව පරිහරණය සඳහා ප්‍රධාන වශයෙන් ම උසස් අධ්‍යාපන ආයතන ඇතුළු වෙනත් පර්යේෂණ ආයතනවලට සම්බන්ධ පර්යේෂකයින්, පශ්චාද් උපාධි හා සාමාන්‍ය උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයින්, ජනමාධ්‍යවේදීන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල පාඨකයින් පැමිණ තිබේ. ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මහල් තුනක ප්‍රධාන කියවීම් ශාලා තුනක් ද, බිම් මහලේ විශේෂ තොරතුරු කවුන්ටරයක් ද (Information Counter) පාඨක සේවා අංශය තුළ පවත්වාගෙන යනු ලැබේ. ආයතනයේ නවීකරණ කටයුතු ආරම්භ කිරීමත් සමඟ පළමු, දෙවන හා තෙවන මහල්වල නවීකරණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබේ. ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු හේතුවෙන් මෙම මහල්වල පොත් එකතු පවත්වාගෙන යාම සහ පාඨක සේවා පවත්වාගෙන යාම දුෂ්කර වී තිබේ.

## පාඨක ලියාපදිංචිය

මෙම වසරේ දී පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගෙන ඇති අතර ඒ වෙනුවෙන් ලැබී ඇති ආදායම රු. 270,100.00කි.

| සාමාජික කාණ්ඩය | | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| යාවජීව සාමාජිකත්වය | - | 75 |
| වාර්ෂික සාමාජිකත්වය | - | 41 |
| ත්‍රෛමාසික සාමාජිකත්වය | - | 267 |
| දෛනික සාමාජිකත්වය | - | 2131 |

## විමර්ශන සේවය හා තොරතුරු සැපයීමේ සේවය

මෙම වසර තුළ ජාතික පුස්තකාලයේ විවිධ තොරතුරු මූලාශ්‍ර මඟින් පාඨකයින් සඳහා විමර්ශන සේවා (Reference Services) හා තොරතුරු සේවා (Information Services) සපයා තිබේ. වැඩි වශයෙන් පරිහරණය කරනු ලබන තොරතුරු මූලාශ්‍ර වශයෙන් පුවත්පත්, වාර සඟරා, රජයේ ප්‍රකාශන ආදිය හැඳින්විය හැකි ය. 2020 වසරේ ජාතික පුස්තකාල එකතුවෙන් පාඨක පරිශීලනය සඳහා මූලාශ්‍ර 122,216ක් ලබා දී තිබේ.

## විමසීම් සේවය

විවිධ විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු විමසා පුද්ගලයන්ගෙන් ලැබෙන විමසීම්වලට පිළිතුරු සැපයීම ද මෙම අංශය ඉටුකරන තවත් සේවාවකි. මේ යටතේ ලිපි, විද්‍යුත් තැපැල්, දුරකථන මඟින් හා පැමිණ කළ විමසීම්වලට පිළිතුරු සපයා තිබේ. 2020 වසර තුළ විමර්ශන සේවාව යටතේ පාඨකයින් 6342ක් වෙනුවෙන් තොරතුරු ලබා දී තිබේ. ඉන් ලද ආදායම රු. 97,500.00කි.

## ප්‍රතිරූපන පිටපත් සේවය

ප්‍රතිරූපන පිටපත් ක්‍රමය යටතේ ජාතික පුස්තකාලයේ විවිධ එකතුවල අන්තර්ගත තොරතුරු ලබා ගැනීමට පාඨකයින්ට පහසුකම් සලසා තිබේ. මෙම වසරේ මෙලෙස පිටපත් ලබා දීමෙන් රු. 1,219,715.00ක මුදලක් උපයාගෙන තිබේ.

## ජාතික පුස්තකාලය නැරඹීම

ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදු කිරීම හේතුවෙන් ජාතික පුස්තකාලය නැරඹීමේ අවස්ථා සීමා වී ඇති බැවින් 2020 වසරේ දී ජාතික පුස්තකාලය නැරඹීමේ අවස්ථාව පාඨකයින් වෙත ලබා දී නොමැති අතර, ජාතික පුස්තකාලය මගින් සංවිධානය කරනු ලබන “Meet an expert” වැඩසටහන යටතේ මාර්ගගතව වැඩමුළු 2ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

| දිනය | මාතෘකාව | සම්පත් දායකත්වය |
|---|---|---|
| 2020.09.08 | Literacy Teaching and Learning in the COVID - 19 Crisis and Beyond | ආචාර්ය නාමලී සුරවීර මහත්මිය |
| 2020.12.30 | Bibliotheraphy Enhancing Mental Health for All | සමිතා ඇතුල්දොරආරච්චි මහත්මිය |

## පාඨක අධ්‍යාපන වැඩසටහන් සංවිධානය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පරිහරණය කරනු ලබන පාඨකයින් සඳහා තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබාදීම සහ අවශ්‍ය පුහුණුව ලබාදීම අඛණ්ඩව සිදුවේ.

## ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා එහි සේවාවන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණෙන් ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය පිහිටුවා ගෙන තිබේ. මෙම සංවිධානයේ දායකත්වය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. 2020.01.21 දින ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානයේ 05 වන සාංවත්සරික උත්සවය පවත්වා තිබෙන අතර එම සංවිධානය විසින් මාසිකව සංවිධානය කෙරෙන මාසික සිනමා දැක්ම යටතේ පහත පරිදි චිත්‍රපට 02ක් ප්‍රදර්ශනය කොට තිබේ.

| චිත්‍රපටය | ප්‍රදර්ශනය කළ දිනය |
|---|---|
| ආකාස කුසුම් | 2020.02.28 |
| The Theory of Everything | 2020.09.29 |

## මණ්ඩලයීය ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු

මණ්ඩලයීය ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සිදුවෙමින් පවතින බැවින් රජයේ ප්‍රකාශන එකතුව පාඨක පරිහරණය සඳහා ලබාදීමට හැකි වන පරිදි ස්ථානගත කිරීමත්, විදේශ ග්‍රන්ථ එකතුවෙහි තොග සමීක්ෂණ කටයුතු සිදු කිරීමත්, පාඨකයින්ගේ තොරතුරු ගවේෂණ පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැලසීම කාර්යක්ෂමව සිදු කිරීමට අදාළව පාඨක සේවා බිම් මහල වෙත ජාල පහසුකම් හා දත්ත පදනම් ලබාගැනීමට කටයුතු කර තිබේ.

# තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සේවා සහ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ තොරතුරු තාක්ෂණය යොදාගැනීම හා සම්බන්ධ කටයුතුවල මෙන් ම මෙම ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ උපදේශක සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඊට අමතරව ජාතික ඩිජිටල් පුස්තකාලයේ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම, දැනුම වර්ධනය උදෙසා ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම ඇතුළු ක්ෂේත්‍රයට අදාළ මෘදුකාංග සංවර්ධනය කිරීම මෙම අංශය යටතේ සිදු වේ.

## ජාතික පුස්තකාලයේ වෙබ් සර්වරය (web server) හා මේල් සර්වරය (mail server) පවත්වාගෙන යාම.

ආයතනයේ වෙබ් සර්වරය (web server) හා මේල් සර්වරය (mail server) පවත්වාගෙන යාම සහ පරිගණක දත්ත පදනම් පවත්වාගෙන යාම, පවතින දත්ත පදනම යාවත්කාලීන කිරීම මෙන්ම www.natlib.lk ඩොමේන් ලිපිනය ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

## මණ්ඩලයීය Facebook පිටුව යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විවිධ වැඩසටහන් හා සේවා පිළිබඳ අවබෝධය වැඩි ග්‍රාහක පිරිසක් වෙත ගෙනයෑමේ අරමුණෙන් මණ්ඩලයීය Facebook පිටුව පවත්වාගෙන යන අතර, මණ්ඩලය මඟින් සිදු කරනු ලබන සියලුම ව්‍යාපෘතින්ට අදාළව පැවැත්වෙන විශේෂ අවස්ථාවල ඡායාරූප Facebook පිටුවට ඇතුළත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. මෙම වසර තුළ Facebook පිටුව පරිහරණය කර ඇති සංඛ්‍යාව 13,010කි.

## මණ්ඩලයීය නිවහන් පිටුව යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් හා සේවා පිළිබඳව මණ්ඩලයීය නිවහන් පිටුව (www.natlib.lk) ඔස්සේ අවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලැබේ. මේ මඟින් දුරස්ථව ජාතික පුස්තකාල සේවා සඳහා ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව සලසා දී තිබේ. ජාතික පුස්තකාල සූචියට (OPAC) අමතරව විවිධ දත්ත පදනම්, මණ්ඩලයීය ප්‍රකාශන, ඡායාරූප, දැන්වීම්, පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන සිදුවීම්වලට අදාළ තොරතුරු ආදිය මේ සඳහා ඇතුළත් කරනු ලැබේ. COVID - 19 වසංගත රෝග ව්‍යාප්තිය මැඩලීම සඳහා පුස්තකාල සහ පාඨක ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු පියවර සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කිරීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීමට අදාළ තොරතුරු, ජාතික පුස්තකාල එකතු සංවර්ධන ප්‍රතිපත්තිය, ජාතික කියවීමේ මාසය - 2020 චක්‍රලේඛය, ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය 2020/2021 පිළිබඳ තොරතුරු, මාර්ගගත ISBN පිවිසුම සහ ඒ සම්බන්ධ තොරතුරු, ජාතික ඩිජිටල් පුස්තකාල ප්‍රතිපත්තිය ඇතුළුව MARC 21 විස්තරාත්මක සූචිකරණ රාමුවට අදාළ අත්පොත ද ඇතුළත් කර තිබේ.

## තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු

ආයතනය මගින් පවත්වන පුහුණු වැඩසටහන්වල දී තොරතුරු තාක්ෂණ කටයුතුවලට අදාළ සහාය ලබා දීම තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුස්තකාලයාධිපතිවරු දැනුවත් කිරීම සඳහා සම්පත් දායකත්වය ලබාදීමට පියවර ගෙන තිබේ. මණ්ඩලයේ Easy Way පරිගණක මෘදුකාංගය භාවිත කරනු ලබන පාඨක සේවා අංශය, පොත් අලෙවිහල සහ ගබඩාවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වා තිබේ.

## තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික ආයතන හා සංවිධාන සමග කටයුතු කිරීම

මේ යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ශ්‍රී ලංකා පදනම් ආයතනය හා එක්ව Office 365 මෘදුකාංගය මහජන පුස්තකාල වෙත හඳුන්වා දීමට කටයුතු කර තිබේ.

## ආයතනයේ සියලු ම අංශවල පරිගණක කටයුතු අධීක්ෂණය කිරීම

මණ්ඩලයේ විවිධ අංශවල පරිගණක දෘඩාංග හා මෘදුකාංග සම්බන්ධව ඇතිවන ගැටලු සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීමට පියවර ගෙන තිබේ. ජාතික පුස්තකාලයේ සේවා කටයුතු පහසු කරලීම සඳහා අවශ්‍ය ජංගම දුරකථන මෘදුකාංගයක් (Mobile App) සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කිරීමට කටයුතු කර තිබේ. මීට අමතරව කැනේඩියානු පොදු රාජ්‍ය මණ්ඩලයීය ඉගෙනුම් සංගමය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන Skills online Sri Lanka ව්‍යාපෘතියේ ප්‍රචාරක කටයුතු සඳහා සහායවීම සහ ඊට අදාළ වෙබ් පිටුව නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර තිබේ. මණ්ඩලය මගින් සම්පාදනය කරනු ලබන NATNET LANKA පුවත් හසුනේ 2019 ජූලි දෙසැම්බර් කලාපයේ මෘදු පිටපත සැකසීම, මණ්ඩලයේ පර්යේෂණ අංශය මගින් සංවිධානය කරනු ලබන පර්යේෂණ ක්‍රම විද්‍යා වැඩමුළුවට අදාළ පෝස්ටර් සහ පත්‍රිකා සැකසීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ නව ලාංඡනය නිර්මාණය සහ නව ලිපි ශීර්ෂයේ මෘදු පිටපත සැකසීම, ජාතික පුස්තකාල පනතෙහි මෘදු පිටපත සැකසීම සහ පාඨක සේවා අංශයේ අත්පත්‍රිකා ඇතුළු ඩිජිටල් පුස්තකාල ඒකකයේ අත්පත්‍රිකා සකස් කිරීමේ කටයුතු ද සිදු කර තිබේ. මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන **රටක් වටින පොතක් පොත් 10000ක් ලිවීමේ ව්‍යාපෘතිය** යටතේ මණ්ඩලයට ලැබුණු ළමා අත්පිටපත් 41000කට ආසන්න සංඛ්‍යාවක තොරතුරු ඇතුළත් කිරීම සඳහා නව දත්ත පදනමක් නිර්මාණය කිරීම සහ ඊට අදාළ උපදෙස් ලබා දීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සම්බන්ධ පාඨකයින්ගේ ඇමතුම් තොරතුරු ඇතුළත් කිරීම සඳහා Google Sheet ආදර්ශයක් සකස් කිරීම සිදු කොට තිබේ.

# ග්‍රන්ථ විඥාපන පාලන අංශය

ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික වශයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය, සාධිකාරී ලේඛන සම්පාදනය හා විශේෂ ග්‍රන්ථ නාමාවලි හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන ව්‍යාපෘති වැඩිදියුණු කොට පවත්වාගෙන යාම මූලික වේ.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම ජාතික පුස්තකාලය සතු ප්‍රධාන වගකීමකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු රට තුළ පළවන සියලු ම ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් සාධිකාරී ප්‍රකාශනයකි. මෙම කාර්යය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1974 වර්ෂයේ සිට ඉටු කරනු ලබයි. 1962 සිට 1973 දක්වා මෙම කාර්යය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2019 මාර්තු කලාපයේ සිට 2020 පෙබරවාරි කලාපය දක්වා කලාප 12ක් සම්පාදනය කොට තිබේ. 2020 මාර්තු කලාපයේ සිංහල/දෙමළ/ඉංග්‍රීසි තැන්පතු පිටපත් සඳහා ඩිවි දශම වර්ග අංක යෙදීම, කොංග්‍රස් විෂය ශීර්ෂ ග්‍රන්ථවලට යෙදීම හා Koha දත්ත පදනමට ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කිරීම ඇතුළු ව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (මාර්තු) කලාපය සඳහා අවශ්‍ය තොරතුරු දත්ත පදනම මඟින් ලබාගැනීම ආරම්භ කර තිබේ. ප්‍රකාශිත සියලු ම ජාතික ග්‍රන්ථ නාමාවලිවල අඩංගු තොරතුරු ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library) වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකිය. (www.natlib.lk)

## ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වාර සඟරාවල ඇතුළත් ලිපි පිළිබඳ තොරතුරු පාඨකයන් හට පහසුවෙන් සොයාගැනීම සඳහා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ. මෙය ත්‍රෛමාසික ප්‍රකාශනයක් වන අතර 2018/03 කලාපයේ සිට 2019/3 කලාපය දක්වා කලාප 05ක සම්පාදන කටයුතු නිම කර තිබේ. ඊට අමතරව 2020/1 කලාපය පරිගණක ගත කිරීමට සූදානම් කොට ඇති අතර 2020/2 කලාපය සිංහල/ඉංග්‍රීසි විෂය අංශයන්ට අදාළ ලිපි සඳහා ඩිවි දශම වර්ග අංක යෙදීම හා විෂය ශීර්ෂ යෙදීම සිදු කර ඇත. මෙම තොරතුරු ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library) වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකිය. (www.natlib.lk)

## ජාතික පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍ර සූචිගත කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අත්පත්කර ගනු ලබන පුස්තකාල සම්පත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කොට Koha පුස්තකාල පරිගණක මෘදුකාංගය ඇසුරෙන් පරිගණකගත සූචිය සකස් කිරීමත්, ජාතික පුස්තකාල සූචිය පවත්වාගෙන යාමත් මෙම අංශයේ තවත් කාර්යයක් වේ. ජාතික පුස්තකාල එකතුව පිළිබඳ තොරතුරු පාඨකයින්ට ලබාගැනීමේ එකම මාර්ගය ජාතික පුස්තකාල සූචිය වේ. එබැවින් ජාතික පුස්තකාල සූචිය විද්‍යාත්මකවත්, පහසුවෙන් තොරතුරු ලබාගත හැකි ආකාරයෙනුත් සකස් කෙරේ. ජාතික පුස්තකාලය සඳහා අත්පත් කරගන්නා

සියලු ම පුස්තකාල සම්පත් අන්තර්ජාතික ප්‍රමිති අනුව සූචිගත කිරීම, වර්ග කිරීම හා කොන්ග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ යෙදීම මෙන් ම පරිගණකගත කිරීමේ කටයුතු සිදු වේ. 2020 වර්ෂය තුළ පුස්තකාල තොරතුරු මූලාශ්‍ර 8411ක් සහ වාර සඟරා ලිපි 1232ක් Koha දත්ත පදනමට ඇතුළත් කර තිබේ. ඊට අමතරව 2011-2018 කාල සීමාවට අදාළ පශ්චාද් උපාධි නිබන්ධන නාමාවලියේ සංස්කරණ කටයුතු අවසන් කිරීම හා මාර්ගගත දත්ත පදනමක් ලෙස සම්පාදනය කිරීම සිදු කර තිබේ. ඒ අනුව පාඨකයින්ට මාර්ගගත ප්‍රවේශය ලබා දීම සඳහා අවශ්‍ය තාක්ෂණික සංස්කරණ කටයුතු සිදු කොට ජාතික පුස්තකාල වෙබ් අඩවියට ඇතුළත් කොට තිබේ.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදන ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම පිළිබඳ කමිටු රැස්වීමක් පවත්වා එම කමිටුවේ දී හඳුනාගත් යම් යම් සංශෝධනයන් ප්‍රතිපත්තිය සඳහා ඇතුළත් කිරීමට කටයුතු කර තිබේ.

## ප්‍රකාශනගත සූචිකරණ දත්ත - Cataloguing in Publication Data (CIP)

දිවයිනේ පුස්තකාලවල සූචිකරණ හා වර්ගීකරණ කටයුතුවල සමරූපී බවක් ඇති කිරීම සඳහා කිසියම් ප්‍රකාශනයකට අදාළ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එම කෘතියෙහි ම මුද්‍රණය කිරීම මෙමගින් සිදු වේ. ඒ අනුව 2020 වර්ෂයේ දී කර්තෘවරුන් හා ප්‍රකාශකයින් විසින් කෘති 232ක් (සිංහල 181ක්, දෙමළ 17ක් හා ඉංග්‍රීසි 34ක්) සඳහා ප්‍රකාශනගත සූචිකරණ දත්ත ලබාගෙන තිබේ.

## පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කමිටු රැස්වීම් 05ක් පවත්වා තිබේ. ඒ අනුව සකස් කරන ලද MARC 21 ආකෘතිය ඇසුරෙන් ග්‍රන්ථයන් සඳහා විද්‍යාත්මකව දත්ත ඇතුළත් කිරීමට අවශ්‍ය විස්තරාත්මක සූචිකරණ රාමුව ජාතික පුස්තකාල වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ.

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතියට අනුව සකස් කරන ලද විස්තරාත්මක සූචිකරණ රාමුව පිළිබඳව පුස්තකාලයාධිපතිවරු දැනුවත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණයක් 2020.12.18 දින පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයේ සම්පත් දායකයින් ලෙස ආචාර්ය රුවන් ගමගේ, ආචාර්ය ප්‍රියංවදා වනිගසූරිය, නිමල් හෙට්ටිආරච්චි, හර්ෂ බාලසූරිය, වරුනි ගඟබඩආරච්චි යන මහත්ම මහත්මීන් කටයුතු කළ අතර, එම සම්මන්ත්‍රණය සඳහා පුස්තකාල ක්ෂේත්‍රය නියෝජනය කරමින් 70 දෙනෙකු පමණ සහභාගී වී තිබේ.

# සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

ජාතික පුස්තකාල එකතුවට අයත් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙන් ම දිවයිනේ වෙනත් පුස්තකාලවල එකතු සංරක්ෂණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම අංශයේ කාර්යභාරය වේ. මේ යටතේ ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම, ධූමායනය, පොත් බැඳීම, අලුත්වැඩියා කිරීම හා ජාතික පුස්තකාල එකතුව සහිත ප්‍රදේශයේ වායුසමනය පාලනය කිරීම, ආර්ද්‍රතා පාලනමාන සවි කිරීම මඟින් නිසි තෙතමනය (humidity) ආරක්ෂා කිරීමටත් කටයුතු කරනු ලැබේ. මීට අමතරව ජාතික මට්ටමේ පුස්තකාල සංරක්ෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය උපදේශක දායකත්වය ලබා දීම සිදු වේ. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහන (MoW) සහ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහන (ICH) මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

## පොත් බැඳුම්හල

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කර බැඳුම් කටයුතු කිරීම බැඳුම්හලේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව 2020 වසරේ දී පොත් බැඳුම්හල මඟින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ජාතික එකතුවේ පොත් 513ක් සහ ගැසට් 5ක් බැඳීම
- බණ්ඩාරගම සෝමා ජයකොඩි ආදර්ශ පුස්තකාලයේ පොත් 322ක් බැඳීම.
- විවෘත පුස්තිකා පෙට්ටි 34ක් හා සංවෘත පුස්තිකා පෙට්ටි 238ක් සකස් කිරීම.
- විවිධ අංශවල අවශ්‍යතා අනුව ලේඛන සහ පොත්වල බැඳුම් කටයුතු සිදුකිරීම.

## ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා මනාව පවත්වාගෙන යාම.

ජාතික පුස්තකාල එකතුවේ ආරක්ෂාව සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර තිබේ. අවශ්‍ය අවස්ථාවල දී ජාතික පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු සඳහා උපදෙස් ලබාදීම සිදුකර තිබේ.

## ධූමායනය

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කිරීමේ ප්‍රධාන ක්‍රියාමාර්ගය වශයෙන් පොත් ධූමායනය කිරීම සිදු කරනු ලැබේ. මෙම වසරේ ජාතික එකතුවේ පොත් 513ක් සහ ගැසට් 05ක් තයිමෝල් ධූමායනය කිරීම, ශ්‍රී ලංකා එකතුවේ කෘමි උවදුරට ලක් වූ පොත් පොස්ෆීන් ධූමායනය කිරීම, රටක් වටින පොතක් ව්‍යාපෘතියට ලද පොත් කෘමීන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පොස්ෆීන් ධූමායනය කිරීම සහ ප්‍රතිග්‍රහණ අංශය මඟින් අත්පත් කර ගන්නා ලද පෞද්ගලික පොත් එකතු ධූමායනය කිරීමට ද කටයුතු කර තිබේ.

## ලේඛන ප්‍රතිසංස්කරණ ඒකකය පවත්වාගෙන යාම

මේ යටතේ ජාතික පුස්තකාල එකතුවට අයත් පොත් 14ක පිටු 2423ක් නිරාම්ලීකරණය කර තිබෙන අතර, පිටු 2416ක් ටිෂූ යොදා සකස් කර තිබේ.

## ලෝකයේ මතකය සුරැකීම පිළිබඳ වැඩසටහන (MoW)

යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහනේ ජාතික නාභිගත මධ්‍යස්ථානය (Focal Point) ලෙස කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය වන්නේ ලෝකයේ මතකය සුරැකීමට අදාළ ව ශ්‍රී ලංකාවට අනන්‍යතාවක් සහිත දැනුම් ක්ෂේත්‍ර පිළිබඳව විද්වත් වාර්තා සකස් කොට යුනෙස්කෝ සංවිධානයට අයත් යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහන (UNESCO Memory of the World) වෙත යොමු කිරීමයි. මේ යටතේ ශ්‍රී ලංකාවට උරුම පැරණිතම ලේඛනයක් ලෙස සැලකෙන මහාවංශය පුස්කොළ පොත පිළිබඳ විද්වත් ලේඛනයක් සකස් කොට යුනෙස්කෝ ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහනට ඇතුළත් කිරීමට සලකා බැලීම සඳහා යොමු කිරීමට පියවර ගෙන තිබේ. මෙම ලේඛන සකස් කිරීමට ඒ පිළිබඳ විෂය විශේෂඥයකු වන ආචාර්ය නිලාන් කුරේ මහතාගේ සහය ලබාගෙන තිබේ.

මෙම යුනෙස්කෝ මතකය සුරැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික කමිටුවක් පත් කර තිබෙන අතර, එම කමිටුව 2020.03.06 දින සහ 2020.08.26 දින මණ්ඩලයේ දී රැස් වී තිබේ.

## අස්පර්ශණීය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමේ වැඩසටහන (ICH)

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහනේ (Intangible Cultural Heritage) නාභිගත මධ්‍යස්ථානය ලෙස කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාව තුළ පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ දැනුම හා තොරතුරු ඒකරාශී කිරීම සඳහා ජාතික වශයෙන් වැදගත් වන තොරතුරු යුනෙස්කෝ අස්පර්ශනීය සංස්කෘතික උරුම ලේඛනයට ඇතුළත් කිරීම සඳහා යෝජනා කිරීමයි.

ඒ අනුව මෙම වසරේ දී ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දුම්බර රටා කළාල පිළිබඳ ව විද්වත් වාර්තාවක් සකස් කොට යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ. මෙම විද්වත් වාර්තාව සකස් කිරීම සඳහා ඒ පිළිබඳ ව විශේෂඥ දැනුමක් සහිත විද්වතෙකු වන මහාචාර්ය බී. ඩී. නන්දදේව මහතාගේ සහය ලබාගෙන තිබේ.

ඊට අමතරව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ධීවර ක්‍රමයක් වන රිටිපන්න ධීවර කර්මාන්තය පිළිබඳ වාර්තාවක් සකස් කොට යුනෙස්කෝ සංවිධානය වෙත යොමු කිරීම සම්බන්ධයෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග මූලික සාකච්ඡාවක් පවත්වා තිබේ.

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීම යටතේ ශ්‍රී ලාංකික සමාජය සතු පැරණි ජනකතා ඒකරාශී කොට **ජාතික ජනකතා සංග්‍රහය** නමින් කෘතියක් සම්පාදනය කොට තිබෙන අතර, එහි අවසන් සංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. මෙම තොරතුරු මණ්ඩලයීය නිල වෙබ් පිටුවට ද ඇතුළත් කර තිබේ. (www.natlib.lk)

## IFLA PAC මධ්‍යස්ථානයේ කටයුතු

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයට අනුබද්ධිතව පිහිටුවා තිබෙන සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන මධ්‍යස්ථානයේ (International Federation of Library Association - Preservation and Conservation) කලාපීය මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය තුළ ස්ථාපිත කර තිබේ. මෙමගින් ශ්‍රී ලංකාව ප්‍රමුඛව කලාපයේ රටවල පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් මතුවන ගැටලු හඳුනාගැනීම සහ විසඳුම් යෝජනා කිරීම මූලික අරමුණ වේ. මේ යටතේ පුස්තකාල පොත් ආශ්‍රිතව හටගන්නා පළිබෝධකයින් හා පුස්කොළ පොත් සංරක්ෂණය පිළිබඳ වාර්තාවක් සකස් කොට IFLA ආයතනය වෙත යොමු කිරීමට පියවර ගෙන තිබේ. ඊට අමතරව පුස්තකාල ද්‍රව්‍ය

මත හටගන්නා දිලීර හා බැක්ටීරියා වර්ග මර්දනයට ගත හැකි පියවර පිළිබඳ අඩංගු වාර්තාවක් IFLA PAC මධ්‍යස්ථානයට අදාළ ව මණ්ඩලයීය වෙබ් පිටුව ඔස්සේ පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කිරීමට පියවර ගෙන තිබේ.

## පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම

| පුහුණු පාඨමාලාවේ නම | ස්ථානය | පුහුණුලාභීන් | සහභාගි වූ සංඛ්‍යාව | කාලසීමාව |
|---|---|---|---|---|
| පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු වැඩමුළුව . අදියර II | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | ලේඛනාගාර භාර නිලධාරින් | 15 | 2020.02.11--12 |
| ලේඛන සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය, වක්වැල්ල, ගාල්ල | කාර්යාල සේවකයින් | 30 | 2020.02.13--14 |
| ලේඛන සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | ලේඛනාගාර භාර නිලධාරින් | 16 | 2020.09.15--16 |
| ලේඛන සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ පාඨමාලාව | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය, ත්‍රිකුණාමලය | පුස්තකාල සහායකයින් | 28 | 2020.12.22--23 |

## පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා දුම්මල තෙල් නිස්සාරණය කිරීම

මෙම වසරේ දී අවශ්‍යතාව පරිදි දුම්මල තෙල් බෝතල් 17ක් නිස්සාරණය කර තිබේ. තව ද දුම්මල තෙල් අලෙවි කිරීම වෙනුවෙන් ලියාපදිංචි කළ වෙළඳ ලකුණ **පන්හිඳ** නමින් රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීමට අදාළ කටයුතු සිදු කොට තිබේ.

## සංරක්ෂණ කටයුතු පිළිබඳ උපදෙස් සැපයීම හා ප්‍රමිති සම්පාදනය

ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාළ ප්‍රමිති සම්පාදනය කිරීමේ මූලික කාර්යභාරය ඉටු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. මේ යටතේ පහත සඳහන් පරිදි අවශ්‍ය උපදෙස් ලබාදීම් සිදු කර තිබේ.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු තාක්ෂණික පුස්තකාලය පරීක්ෂා කර වාර්තාවක් ලබාදීම.
- COVID - 19 සමඟ පුස්තකාල විවෘත කරන ආකාරය පිළිබඳ උපදෙස් සංග්‍රහයක් සකස් කිරීමට දායකත්වය ලබා දී තිබේ. මෙම උපදෙස් සංග්‍රහය Exit Strategy from Covid -19 for Libraries in Sri Lanka නමින් ප්‍රකාශයට පත් කර තිබේ. මෙම උපදෙස් සංග්‍රහය කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) මඟින් ප්‍රකාශයට පත් කර තිබේ. COVID - 19 වසංගත කාලය තුළ COVID - 19 සමඟ පුස්තකාල කටයුතු පවත්වාගෙනයාම පිළිබඳ පුස්තකාල සඳහා වන පොදු උපදෙස් සංග්‍රහයක් වරින් වර චක්‍රලේඛ ලෙස නිකුත් කිරීමට පියවර ගෙන තිබේ.

- ජනාධිපති කාර්යාලයේ පුස්තකාලය පරීක්ෂා කොට එහි ඇති පොත් සංරක්ෂණය කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ පුස්තකාලය පොස්පීන් ධූමායනය කිරීමට අදාළ කටයුතු අධීක්ෂණය කර තිබේ.

- ජෝර්ජ් ස්ටුවර්ට් සමාගමේ ප්‍රධාන කාර්යාලයීය පුස්තකාලය පරීක්ෂා කොට එය සංරක්ෂණය කිරීම සඳහා උපදෙස් ලබා දී තිබේ.

- ඓතිහාසික බෙන්තොට වනවාසී රජමහා විහාරස්ථ ශ්‍රී පණ්ඩිතරත්න පිරිවෙන වෙත 2020.07.29 දින ගොස් පැරණි පොත් හා පුස්කොළ පොත් සංරක්ෂණයට උපදෙස් ලබා දීම.

- COVID-19 වසංගතය හේතුවෙන් වසා තිබූ මහජන පුස්තකාල නැවත විවෘත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු උපදෙස් අඩංගු පෝස්ටරයක් සකස් කර සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම.

# පුස්තකාල පර්යේෂණ අංශය

පළාත් මට්ටමින් පුස්තකාල සමීක්ෂණ කටයුතු සිදු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු රැස් කිරීම, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ තෝරාගත් මාතෘකා පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, පුස්තකාල කටයුතු පිළිබඳ මාධ්‍ය තොරතුරු රැස්කිරීම හා පර්යේෂණ වැඩමුළු පැවැත්වීම සහ පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙම අංශයේ මුඛ්‍ය කාර්යභාරය වේ.

## ජාතික මට්ටමේ සමීක්ෂණ පැවැත්වීම

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ ව ජාතික මට්ටමේ සමීක්ෂණ පැවැත්වීම මණ්ඩලයේ පර්යේෂණ අංශයේ එක් ප්‍රධාන වගකීමකි. මේ යටතේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ආශ්‍රිත පාඨකයින්ගේ කියවීමේ රුචිය පිළිබඳ සමීක්ෂණයේ මූලික කටයුතු අවසන් කර තිබෙන අතර, එහි සංස්කරණ කටයුතු සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන අධ්‍යයන අංශය වෙත යොමු කොට තිබේ. සංස්කරණ කටයුතු නිම වීමෙන් පසු සමීක්ෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## පර්යේෂණ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම

### i. වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය සංවිධානය කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් වාර්ෂිකව පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබේ. මෙහි අරමුණ වන්නේ පුස්තකාල ක්ෂේත්‍රයේ විද්‍යාර්ථීන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ එළිදැක්වීම සඳහා අවශ්‍ය පසුබිම සකසා දීමයි. මේ යටතේ මෙවර පැවති වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය “IC NATLIB 2020” නමින් සැලසුම් කළ ද, පැවති COVID-19 වසංගත තත්වය හමුවේ මෙම සම්මන්ත්‍රණය සංවිධානය කිරීමට නොහැකි විය.

### ii. පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ දෙදින සම්මන්ත්‍රණ 05ක් මෙම වසර තුළ සංවිධානය කිරීමට සැලසුම් කළ ද පැවති COVID - 19 වසංගත රෝග තත්වය මත සම්මන්ත්‍රණ 02ක් පමණක් සංවිධානය කරන ලදී.

| දිනය | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව | ලද ආදායම (රුපියල්) |
|---|---|---|---|
| 2020.09.07--08 | මණ්ඩලයීය ශ්‍රවණාගාරය | 27 | 120,000.00 |
| 2020.09.24--25 | මණ්ඩලයීය ශ්‍රවණාගාරය | 31 | 147,500.00 |

## පර්යේෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධ ප්‍රකාශන පළ කිරීම

### i. ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ සංඛ්‍යානමය අත්පොත සම්පාදනය කිරීම (Statistical Handbook on Libraries in Sri Lanka 2020)

ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමේ අරමුණින් සෑම වසරකම පුස්තකාල පිළිබඳ සංඛ්‍යානමය අත්පොත සකස් කිරීම සහ එහි තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ. මේ යටතේ, ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, පාසල්, පිරිවෙන් රජයේ සහ රජයේ නොවන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල පිළිබඳ තොරතුරු මෙම අත්පොතට ඇතුළත් කරනු ලැබේ. ඊට අමතරව ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ අරමුණින් මහජන පුස්තකාල පිළිබඳ දත්ත පදනමක් ගොඩනැගීම සඳහා තොරතුරු ඒකරාශී කර තිබේ.

### ii. පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ ආචාරධර්ම සංග්‍රහයක් (Ethical Guideline) සැකසීම

පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සිදු කිරීමේ දී විද්‍යාර්ථීන් විසින් පිළිපැදිය යුතු පර්යේෂණ ආචාරධර්ම හඳුන්වාදීම මෙහි අරමුණ වේ. මේ සඳහා වෙනත් රටවල ක්‍රියාත්මක වන ආචාරධර්ම පද්ධති සහ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආචාරධර්ම පද්ධති පිළිබඳ විශේෂ අධ්‍යයනයක් සිදු කොට සකස් කරන ලද මූලික කෙටුම්පත වැඩිදුරටත් අධ්‍යයනය සඳහා පර්යේෂණ උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කොට තිබේ.

# ඩිජිටල් පුස්තකාල ඒකකය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ඩිජිටල් පුස්තකාල කටයුතු පවත්වාගෙන යාමේ අරමුණෙන් 2016 වසරේ සිට ඩිජිටල් පුස්තකාල ඒකකය ස්ථාපිත කර තිබෙන අතර එය තොරතුරු තාක්ෂණ හා පාඨක සේවා යන අංශවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙම ඩිජිටල් පුස්තකාල ඒකකය මගින් ඩිජිටල්කරණය සඳහා තොරතුරු සම්පත් හඳුනා ගැනීම, ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා දැනට එක්රැස් කර ඇති තොරතුරු DSpace දත්ත පදනමට ප්‍රවේශ කිරීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සුදුසු ඩිජිටල් ප්‍රකාශන හා තොරතුරු ඒකරාශි කිරීම, පාඨකයින් සඳහා ඩිජිටල් තොරතුරු සේවා සැපයීම, ආදී කටයුතු මෙම ඒකකයෙන් සිදු කෙරේ.

## ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම

ශ්‍රී ලංකා ජාතික ඩිජිටල් පුස්තකාලය සම්බන්ධයෙන් සකස් කර තිබෙන ජාතික ඩිජිටල් පුස්තකාල ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට කටයුතු කර තිබේ. ඩිජිටල් පුස්තකාල ඒකකය මගින් ඒකරාශී කර තිබෙන ප්‍රකාශන විවෘත ප්‍රවේශය යටතේ පාඨකයන් වෙත නිකුත් කිරීමට අදාළ **විවෘත ප්‍රවේශ ප්‍රතිපත්තිය** සකස් කර අවසන් කිරීමට ද පියවර ගෙන තිබේ.

## ජාතික පුස්තකාල එකතුව ඩිජිටල්කරණය කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පැරණි ගැසට් එකතුවෙන් 1950 වසරේ සිට 1957 වසර දක්වා ප්‍රකාශිත රජයේ ගැසට් පත් ඇසුරින් සංඛ්‍යාංකකරණය කරන ලද තොරතුරු DSpace දත්ත පදනමට ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. ඊට අමතරව 2017 සහ 2018 වසරවල ප්‍රකාශිත රජයේ ගැසට්පත්‍ර 8187ක් බාගතකර, දත්ත 3050ක් DSpace දත්ත පදනමට එක් කිරීමට පියවර ගෙන තිබේ.

## වෙනත්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් ප්‍රකාශිත ප්‍රකාශන සඳහා ජාතික ඩිජිටල් පුස්තකාලය මගින් ප්‍රවේශ පහසුකම් ලබා දීමට පියවර ගෙන තිබේ. ඒ ඔස්සේ ජාතික කියවීමේ මාසය 2020 වැඩසටහනට අදාළ චක්‍රලේඛය, නැති වූ පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ චක්‍රලේඛය, ඩිජිටල් පුස්තකාල ප්‍රතිපත්තිය සහ ඩිජිටල් පුස්තකාල විවෘත ප්‍රවේශ ප්‍රතිපත්තිය ඇතුළුව ජාතික ග්‍රන්ථ නාමාවලියේ මෙතෙක් ප්‍රකාශිත කලාප සඳහා ප්‍රවේශ පහසුකම් ලබාදීමට ද පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ මෙන් ම ලොව විවිධ රටවල පර්යේෂණ වැඩමුළු සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකාව හා සම්බන්ධ ආයතනයක් වන Global Academic Reseach Institute (GARI) සමග පර්යේෂණ ලිපි ලබාගැනීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබෙන අතර, එම ආයතනය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ලිපිවල මෘදු පිටපත් ජාතික ඩිජිටල් පුස්තකාලයට එක් කර තිබේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් පවත්වාගෙන යනු ලබන විවිධ දත්ත පදනම් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) අනුග්‍රහය යටතේ Lanka Government Cloud (LGC) පහසුකම ලබා ගැනීම සඳහා එම ආයතනය සමග ගිවිසුමකට එළඹීමට කටයුතු කර තිබේ.

# ව්‍යාප්ති සේවා අංශය

මෙම අංශය මගින් රට තුළ විසිරී පවත්නා විවිධ වර්ගයේ පුස්තකාල සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වීම, උපදේශක සේවා සැපයීම, කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරු දිරිමත් කිරීම, ජාතික කියවීමේ මාසයේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල සඳහා පොත් ආධාර ලබා දීම හා පුස්තකාල සංවර්ධනය කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, පුස්තකාල සඳහා සුදුසු පොත් නිර්දේශ කිරීම, ඩිජිටල් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වැනි ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

## ජාතික කියවීමේ මාසය වැඩසටහන

පාඨක ප්‍රජාව අතර පොතපත කියවීම දිරිගැන්වීමේ අරමුණෙන් 2004 වසරේ සිට සෑම වසරක ම එළඹෙන ඔක්තෝබර් මාසය **ජාතික කියවීමේ මාසය** ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. මෙම වසරේ ජාතික කියවීමේ මාසය සමාරම්භය සනිටුහන් කරමින් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.10.01 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 5ක් නියෝජනය වන පරිදි පාසල් සඳහා පුස්තකාල පහසුකම් සහිත බස්රථ ලබාදීම සිදු කරන ලදි. මෙම බස්රථ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව පැවති ගර්හිත තත්වයේ බස්රථ වන අතර, මෙම විශේෂ ව්‍යාපෘතිය සඳහා ඒවා අලුත්වැඩියා කර ලබා දී තිබේ. **බසයෙන් අනාගතයට බස්රථ පුස්තකාල ව්‍යාපෘතිය** ලෙස නම්කර තිබෙන මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග දෙරණ මාධ්‍ය ජාලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම අනුග්‍රාහක දායකත්වය ලබා දී තිබේ.

මෙම බස් රථයට අමතරව අදාළ සෑම පාසලක් සඳහා ම බස්රථ පුස්තකාලයට අවශ්‍ය පොත්පත් ඇතුළුව අන්තර්ජාල පහසුකම් සහිත ටැබ් යන්ත්‍රයක් මෙන් ම රූපවාහිනී යන්ත්‍රයක් ද එක් කර තිබේ. ඒ අනුව මෙම වසරේ පාසල් පුස්තකාල බස්රථ ලබාදුන් පාසල් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | පාසලේ නම | දිස්ත්‍රික්කය | පරිත්‍යාගය ලබා දුන් දිනය |
|---|---|---|---|
| 01 | දොළොස්බාගේ සිංහල මහා විද්‍යාලය | මහනුවර | 2020.10.05 |
| 02 | ගාල්ල පිලාන විද්‍යාර්ථෝදය විද්‍යාලය | ගාල්ල | 2020.10.07 |
| 03 | ලුණුවිල මධ්‍ය මහා විද්‍යාලය | පුත්තලම | 2020.10.09 |
| 04 | කුරුවිට විජය කුමාරණතුංග විද්‍යාලය | රත්නපුර | 2020.10.13 |
| 05 | කිලිනොච්චි ධර්මපුරම් අංක 01 දෙමළ විද්‍යාලය | කිලිනොච්චිය | 2020.10.21 |

## ජාතික කියවීමේ මාසය සම්බන්ධ වෙනත් වැඩසටහන්

මෙවර ජාතික කියවීමේ මාසයේ වැඩසටහනේ තේමාව **කියවමු පොතක් නංවමු රටක්** ලෙස නම් කර තිබූ අතර, 2020 මාර්තු මස අවසානයේ සිට බලපෑ COVID - 19 වසංගත රෝග තත්වය හේතුවෙන් සැලසුම් කළ බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කෙසේ වුව ද ජාතික කියවීමේ මාසය සම්බන්ධයෙන් ඊට අදාළ උපදේශාත්මක චක්‍රලේඛය සියලුම පුස්තකාල වෙත යොමු කිරීම සඳහා කටයුතු කළ අතර, නම් කරන ලද තේමාවට අනුව සකස් කරන ලද පෝස්ටර් ආකෘතිය සමාජ මාධ්‍ය ඔස්සේ පුස්තකාල වෙත සන්නිවේදනය කිරීමට කටයුතු කරන ලදී. ජාතික කියවීමේ මාසයට අදාළ ප්‍රාදේශීය වැඩසටහන් ලෙස 2020 මාර්තු මස 11 දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් සඳහාත්, 2020 මාර්තු මස 12 දින මැදවච්චිය මහජන පුස්තකාලයේ පාඨක සමාජ සඳහාත් කියවීමේ කඳවුරු පවත්වන ලදී.

## ජාතික පුස්තකාල පොත් අලෙවිහල පවත්වාගෙන යාම

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ජාතික පුස්තකාල පොත්හල පවත්වාගෙන යනු ලබන අතර මෙහි මූලික අරමුණ වන්නේ සහනදායි මිල ගණන් යටතේ පොත්පත් ඇතුළු පුස්තකාල ලිපිද්‍රව්‍ය සහ පුස්තකාල සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ අලෙවි කිරීමයි. මණ්ඩලයීය අලෙවිහල මගින් අලෙවියෙන් පසු මුදල් ලබාගැනීමේ පදනම මත මණ්ඩලය මගින් ප්‍රකාශිත ප්‍රකාශන අලෙවි කිරීම සඳහා බාහිර පොත් අලෙවිහල් වෙත ද ලබා දීමට කටයුතු කර තිබේ. මෙම වසරේ සාහිත්‍ය මාසය නිමිත්තෙන් විශේෂ වට්ටම් යටතේ මණ්ඩලයීය පොත්හල මගින් පොත් අලෙවි කිරීමට ද කටයුතු කරන ලදී. මෙම වසරේ පොත් අලෙවිහලෙන් ලද ආදායම රු. 1,044,438.75කි.

## පොත් ප්‍රදර්ශන පැවැත්වීම

වසර පුරා පැවති COVID - 19 වසංගත රෝග තත්වය හේතුවෙන් දිවයින පුරා සංවිධානය කරනු ලැබූ පොත් ප්‍රදර්ශන රාශියක් පැවැත්වීමට නොහැකි වූ අතර, ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය 2020.09.18 දින සිට 27 දින දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී (BMICH) පැවැත්වූ අතර, මෙම පොත් ප්‍රදර්ශනය සඳහා මණ්ඩලයීය පොත් අලෙවි කුටියක් ද එක් කර තිබේ.

## පොත් පරිත්‍යාග ලබා දීමේ වැඩසටහන

දිවයිනේ පුස්තකාලවල එකතු සංවර්ධනය කිරීමේ එක් මාර්ගයක් ලෙස පුස්තකාල වෙත පොත් ආධාර ලබා දීමේ වැඩසටහනක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළ පුස්තකාල රැසකට පුස්තකාල පොත් පරිත්‍යාග කර තිබේ.

| ආයතනය | ආයතන සංඛ්‍යාව | පොත් සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|---|
| පාසල් පුස්තකාල | 63 | 3776 | 711,751.76 |
| මහජන පුස්තකාල | 03 | 141 | 30,288.75 |
| දහම් පාසල් පුස්තකාල | 18 | 2150 | 469,727.30 |
| අමාත්‍යාංශ පුස්තකාල | 03 | 328 | 70,177.50 |
| ආරක්ෂක අංශයේ පුස්තකාල | 01 | 38 | 9,995.75 |
| වෙනත් පුස්තකාල | 17 | 2340 | 473,139.50 |
| **එකතුව** | **105** | **8773** | **1,765,080.56** |

මීට අමතරව මණ්ඩලයේ පොත් නිර්දේශ කිරීමේ ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය සතුවන පිටපත්වලින් පොත් 244ක් සෝමා ජයකොඩි ආදර්ශ පුස්තකාලය වෙත පරිත්‍යාග කර තිබේ.

## ගෘහස්ථ පුස්තකාල ලියාපදිංචි කිරීම

මෙරට පවත්නා ප්‍රධාන ධාරාවේ පුස්තකාලවලට අමතරව ගෘහස්ථ මට්ටමින් සහ වෙනත් කුඩා පරිමාණයේ සමිති සමාගම්වලට අනුබද්ධිතව ක්‍රියාත්මක වන පුස්තකාල හඳුනාගෙන ඒවා ලියාපදිංචි කිරීමේ වැඩසටහනක් මණ්ඩලය මගින් ආරම්භ කර තිබේ.

## පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම

දිවයිනේ විවිධ පුස්තකාලවල විවිධ අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය උපදේශක සේවා සැපයීම මණ්ඩලයේ එක් ප්‍රධාන කාර්යභාරයක් වේ. මේ යටතේ පහත සඳහන් පුස්තකාල සඳහා මෙම වසර තුළ උපදේශක සේවා සපයා තිබේ.

| පුස්තකාලයේ නම | සපයන ලද සේවා |
|---|---|
| පදියතලාව ප්‍රාදේශීය සභාවේ පදියතලාව මහජන පුස්තකාලය | නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම. |
| කළුතර ප්‍රාදේශීය සභාවට අයත් සුභූති මහජන පුස්තකාලය | ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම. |
| හලා/නාත්/ විද්‍යාරත්න මහ පිරිවෙන් පුස්තකාලය | ප්‍රතිසංවිධාන කටයුතු නිරීක්ෂණය කර වාර්තාවක් ලබා දීම. |
| කොළඹ ජාතික රෝහලේ පුස්තකාලය | රෝහලේ පුස්තකාලය නිරීක්ෂණය කොට අවශ්‍ය උපදෙස් ලබා දීම. |
| අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ පුස්තකාලය | ගොඩනැගිල්ල නිරීක්ෂණය කිරීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම. |

## ග්‍රාමීය පුස්තකාල සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල සීමිත පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන පුස්තකාල සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මේ යටතේ පුස්තකාල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, පොත්පත් සහ ලී බඩු උපකරණ ලබා දීම, කාර්ය මණ්ඩල පුහුණු කිරීම ආදිය මණ්ඩලයේ අනුග්‍රහය යටතේ සිදු කෙරේ. මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද මස්කෙළිය මහජන පුස්තකාලය 2020.01.31 දින විවෘත කළ අතර, ඒ සඳහා අවශ්‍ය පොත්පත් හා ලී බඩු උපකරණ මණ්ඩලය මගින් පරිත්‍යාග කළ අතර, ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු මස්කෙළිය ප්‍රාදේශීය සභාව මගින් සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ම සංවර්ධනය කළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව මහජන පුස්තකාලය සඳහා ද මණ්ඩලය මගින් පොත්පත් හා ලී බඩු උපකරණ පරිත්‍යාග කර තිබේ. ග්‍රාමීය පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව මහජන පුස්තකාලය හා මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය සභාව යටතේ අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත මහජන පුස්තකාලය සම්බන්ධයෙන් මූලික නිරීක්ෂණ කටයුතු මෙම වසරේ දී සිදු කර තිබේ.

## පුස්තකාල පොත් නිර්දේශ කිරීමේ ව්‍යාපෘතිය

පුස්තකාලවල පාඨක පරිහරණය සඳහා සුදුසු පොත් නිර්දේශ කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ මගින් පාඨකයින් සඳහා කියවීමට සුදුසු පොත් පිළිබඳ මග පෙන්වීමක් සිදු කරනු ලබන අතර මෙම වසර තුළ පොත් 67ක් සඳහා නිර්දේශ ලබා දී තිබේ. මෙහි දී ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ අනුමත කෘති 52ක් සඳහා නිර්දේශ ලබා දී තිබේ. 2019 - 2020 වර්ෂය තුළ පුස්තකාල සඳහා සුදුසු පොත් ලෙස නිර්දේශිත කෘති නාමලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, මෙලෙස නිර්දේශිත කෘති සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රචාරක කටයුතු ද සිදු කොට තිබේ.

## ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි ආදර්ශ ඩිජිටල් පුස්තකාල 25ක් ස්ථාපිත කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය දියත් කර තිබේ. මෙම වැඩසටහනේ නියමු අදියර වශයෙන් කොළඹ, කුරුණෑගල, මඩකලපුව, පොළොන්නරුව, බදුල්ල මහජන පුස්තකාලවලට අමතරව පුත්තලම දිස්ත්‍රික්කයේ කිරිමැටියාන මහජන පුස්තකාලයත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ඕපනායක මහජන පුස්තකාලයත් තෝරාගෙන තිබේ. මේ යටතේ සෑම පුස්තකාලයක් සඳහා ම පහත පරිදි උපකරණ පරිත්‍යාග කර තිබේ.

| ලබා දෙන ලද උපකරණය | ප්‍රමාණය |
|---|---|
| පරිගණක | 10 |
| ලැප්ටොප් පරිගණක | 01 |
| ටැබ් යන්ත්‍ර | 15 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 02 |
| බාර්කෝඩ් කියවන යන්ත්‍ර | 02 |
| ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර | 02 |
| ස්ටිකර් රෝල් | 72 |
| පුටු (ළමා) | 16 |
| මේස (ළමා) | 04 |
| සෝපා සෙට් | 01 |
| පරිගණක මේස | 08 |
| පරිගණක පුටු | 09 |

ඊට අමතරව තෝරාගත් පුස්තකාලවල ජාල පහසුකම් ඇති කිරීමට ද පියවර ගෙන තිබේ. මෙම වැඩසටහන මගින් එක් පුස්තකාලයක් සඳහා දළ වශයෙන් වැය කරන මුදල රු. මිලියන 5කට ආසන්න වේ. මේ සඳහා වන ප්‍රතිපාදන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ලබා දී තිබේ.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියරෙහි කටයුතු ද මෙම වසරේ ආරම්භ කළ අතර, සුදුසු පුස්තකාල හඳුනාගැනීම සහ අවශ්‍ය පුහුණු පහසුකම් ලබා දීමේ කටයුතු මණ්ඩලය මගින් සිදු කෙරේ.

## විශේෂ දින සැමරීම

- ජාත්‍යන්තර මව් භාෂා දිනය නිමිත්තෙන් විශේෂ සැමරුම් වැඩසටහනක් 2020.02.24 දින මණ්ඩලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර, එහිදී මහාචාර්ය සඳගෝමි කෝපරහේවා සහ තිලකරත්න කුරුවිට බණ්ඩාර යන මහත්වරුන් විසින් මව් භාෂා දිනය අළලා දේශන පවත්වන ලදී. එම අවස්ථාවට පාසල් සිසුන්, ගුරුවරුන්, ලේඛකයින්, මාධ්‍යවේදීන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

- සෑම වසරකම ජූලි මාසයේ යෙදෙන මහජන පුස්තකාල දිනය වෙනුවෙන් මෙම වසරේ දී ද මහජන පුස්තකාල දිනය සමරා විශේෂ දේශනයක් සංවිධානය කරන ලදී. මෙවර **COVID -19 සමග පුස්තකාල විවෘත කරන්නේ කෙසේ ද?** යන තේමාව යටතේ 2020.07.07 දින Zoom ඔස්සේ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ උදය කබ්රාල් මහතා විසින් දේශනයක් පවත්වන ලදී.

## වෙනත්

පැවති COVID - 19 වසංගත කාල පරිච්ඡේදය තුළ COVID - 19 රෝග වාහකයින් හඳුනාගැනීම සඳහා ICTA ආයතනය හඳුන්වා දුන් **කෝවිඩ් ට්‍රේසර්** වැඩසටහන පළාත් පාලන කොමසාරිස්වරුන් මගින් මහජන පුස්තකාල වෙත හඳුන්වාදීමට කටයුතු කර තිබේ.

# අධ්‍යාපන හා පුහුණු අංශය

අධ්‍යාපන හා පුහුණු අංශයේ මූලික කාර්යභාරය වන්නේ දැනට සේවයේ නියුතු පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩමුළු පැවැත්වීම මගින් ඔවුන් වෙත අඛණ්ඩ වෘත්තීය පුහුණුවක් ලබාදීම වේ. මේ යටතේ මහජන, පාසල්, පිරිවෙන් ආදී විවිධ වර්ගවලට අයත් පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. ඊට අමතරව පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවණතා පිළිබඳව පුස්තකාලයාධිපතිවරු මෙන්ම විවිධ වෘත්තියවේදීන් දැනුවත් කිරීම සිදුවේ.

## පාසල් පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රාථමික පාසල් දරුවන්ගේ කියවීමේ සහ රසවින්දනය ප්‍රවර්ධනය සඳහා පාසල් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

## මෙම වසරේ දී පහත සඳහන් පාසල් පුස්තකාල වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වා තිබේ.

- කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ සිසු දරුවන් සහ ගුරුභවතුන් සඳහා **සිතුවිල්ලෙන් පන්හිඳට** ව්‍යාපෘතියේ මෙහෙයවීම යටතේ ග්‍රන්ථකරණය හා කාව්‍ය නිර්මාණ පිළිබඳ දේශනයක් 2020.01.30 දින පැවැත්වීම.

- බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් 2020.02.20 දින සංවිධානය කරන ලද විශිෂ්ට පුස්තකාල නිර්ණායක සකස් කිරීමේ වැඩමුළුව සඳහා සම්පත්දායකත්වය ලබා දීම.

- වව්නියාව උතුර හා දකුණ අධ්‍යාපන කලාපවල පාසල් පුස්තකාලයාධිපතිවරු සඳහා පුහුණු වැඩසටහනක් 2020.11.10 සහ 11 යන දිනයන්හි දී වව්නියාව ගාමිණි මහා විද්‍යාලයේ දී ද, ඊට සමගාමීව දෙමළ මාධ්‍ය පුහුණු වැඩසටහන වව්නියාව උතුර අධ්‍යාපන කලාප කාර්යාලයේ දී ද පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණ ද පැවති COVID - 19 වසංගත තත්වය හමුවේ පැවැත්වීමට නොහැකි විය.

## මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම උදෙසා කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සභා මට්ටමින් සිදු වේ. මේ සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ද සහාය ලබාගෙන අදාළ වැඩමුළු පැවැත්වේ.

- වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ කිරිමැටියාන මහජන පුස්තකාලයේ ස්වයංක්‍රීයකරණ කටයුතුවල ප්‍රගතිය නිරික්ෂණය කිරීම සඳහා 2020.02.05 දින මණ්ඩලයිය නිලධාරීන් සහභාගි වී තිබේ.

- වෙන්නප්පුව හා වැලිගෙපොල ප්‍රාදේශිය සභා මහජන පුස්තකාල සඳහා පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2020.02.17 හා 18 යන දිනයන්හි දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මේ සඳහා පුස්තකාලයාධිපතිවරුන් ඇතුළු නිලධාරින් 15 දෙනෙකු සහභාගි වී තිබේ.

- 2030 තිරසර මහජන පුස්තකාල සංවර්ධන පුහුණු ව්‍යාපෘතියේ මීළඟ වැඩසටහන පුත්තලම දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා 2020.08.31, 2020.09.01 හා 02 යන දිනයන්හි පුත්තලම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙම වැඩටහන සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වූ අතර සිංහල මාධ්‍යයෙන් සම්පත්ලාභීන් 53 දෙනෙකු හා දෙමළ මාධ්‍යයෙන් සම්පත්ලාභීන් 09 දෙනෙකු සහභාගි විය. උක්ත වැඩසටහනට සමගාමීව 2020.09.01 දින පොත් බැඳුම්කරණය හා සංරක්ෂණය සම්බන්ධ වැඩසටහනක් පුත්තලම මහජන පුස්තකාලයේ දී පවත්වන ලදී. එසේම මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා Microsoft 365 මෘදුකාංගය හඳුන්වාදීමේ කටයුතු ආරම්භ කළ අතර ඒ අනුව, පුත්තලම දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල වෙත විද්‍යුත් ලිපිනයන් සහ මුරපද ලබා දීමට ද කටයුතු කර තිබේ.

## පිරිවෙන් පුස්තකාල හා වෙනත් ආගමික මධ්‍යස්ථාන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා වැඩසටහන් සංවිධානය කිරීම

- කොළඹ දිස්ත්‍රික් ඉස්ලාම් ආගමික පාසල් පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2020.03.23 සහ 24 යන දිනයන්හි දී බේරුවල නලීම්සා අරාබි විද්‍යාලයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණ ද පැවති COVID -19 වසංගත තත්වය හමුවේ පැවැත්වීමට නොහැකි විය.

- බෙන්තොට වනවාසී රජමහා විහාරය ඇතුළු රජමහා විහාර පහක පුස්කොළ පොත් සහ පැරණි අත්පිටපත් සංරක්ෂණය සඳහා සොයා බැලීමට 2020.07.28 දින මණ්ඩලයීය සභාපතිතුමා ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

## වෙනත් පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා වන පුහුණු මොඩියුල සකස්කර ඉදිරිපත් කිරීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට දායකත්වය ලබා දී තිබේ.

## ජාතික පුස්තකාල දේශන මාලාව

- ජාතික පුස්තකාල දේශන මාලාවේ 264වන දේශනය 2020.03.26 දින මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලොචන්දක රණතුංග මහතා සහ කැලණිය විශ්වවිද්‍යාලයේ කර්මාන්ත කළමනාකරණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චතුර රාජපක්ෂ මහතා විසින් **කාර්මික විප්ලවය හා දත්ත විප්ලවයේ සංයෝජනය** මැයෙන් දේශනය පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණ ද පැවති COVID - 19 වසංගත තත්වය හමුවේ පැවැත්වීමට නොහැකි විය.

## පුස්තකාල මෘදුකාංග පිළිබඳ තාක්ෂණික සේවා වැඩමුළු සංවිධානය කිරීම (තොරතුරු තාක්ෂණ අංශය සමග)

- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ (HARTI) 2020.02.27 දින පැවති පළාත් පාලන පිළිබඳ ජාතික ආයතනය මගින් සංවිධානය කළ ශ්‍රී ලංකා පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ කාර්තුමය ජාතික ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල් සහ අංශ ප්‍රධාන සහභාගී වූ අතර එහිදී පළාත් පාලන ආයතන ජාලකරණය හා පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී.

## මණ්ඩලයීය නිලධාරීන් පුහුණු කිරීම.

මණ්ඩලයීය නිලධාරීන් වෙත තම රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය වෘත්තීය හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින් විවිධ පුහුණු පාඨමාලාවලට යොමු කිරීම නිරන්තරයෙන් සිදු වේ. මණ්ඩලයීය නිලධාරීන් පුහුණු කිරීමේ දී අනුගමනය කරනු ලබන කාර්යමණ්ඩල පුහුණු සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු යොදා තිබෙන අතර, ඒ පිළිබඳව මණ්ඩලයීය නිලධාරීන් දැනුවත් කිරීමට ද පියවර ගෙන තිබේ.

- මණ්ඩලයීය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහනක් 2020.01.29 දින පවත්වන ලද අතර, ඒ සඳහා ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ විගණක ලසන්ත ගමගේ මහතා සම්පත් දායකත්වය ලබා දී තිබේ.

## Skills online Sri Lanka වැඩසටහන

ලොව පුරා පැතිර ගිය COVID - 19 වසංගත රෝග තත්වය හමුවේ විශාල පිරිසකගේ රැකියා අහිමි වීම හේතුවෙන් ඔවුන් වෙත නව කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය ඉගෙනුම් සංගමය (Commonwealth of learning-Canada) මගින් ගාස්තු අය කිරීමකින් තොරව ලොව පිළිගත් පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබා දීමේ අරමුණින් **Skills online Sri Lanka** වැඩසටහන හඳුන්වා දී තිබේ. මේ යටතේ ලොව පිළිගත් විශ්වවිද්‍යාල ආශ්‍රිතව කෙටිකාලීන පාඨමාලා 3500කට ආසන්න සංඛ්‍යාවක් හැදෑරීමට අවස්ථාව හිමි ව තිබේ. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ දී එහි ජාතික ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය තෝරාගෙන තිබේ. මෙම සියලුම පාඨමාලා මාර්ගගතව (online) හැදෑරීමට අවස්ථාව ලබා දී තිබේ. මෙම පාඨමාලා සම්බන්ධ මූලික දැනුවත්කිරීමේ කටයුතු, අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු සහ ක්‍රියාත්මක කිරීම අධ්‍යාපන හා පුහුණු අංශය යටතේ සිදු කරනු ලබන අතර මෙහි ජාතික සම්බන්ධීකාරක ලෙස ආචාර්ය ප්‍රමීලා ගමගේ මෙනෙවිය කටයුතු කරනු ලබයි. මෙම වැඩසටහනේ පළමු අදියරයේ දී පාඨමාලා හැදෑරීම සම්බන්ධයෙන් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් අතර ශ්‍රී ලංකාවට පළමු ස්ථානයට පැමිණීමට හැකි වී තිබේ. උක්ත වැඩසටහනේ දෙවන අදියර යටතේ ශිෂ්‍යත්ව 2000ක් පිරිනැමීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වන මාධ්‍ය හමුවක් 2020.08.19 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙහි දෙවන අදියර ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන අතර, මෙම ව්‍යාපෘතිය 2024 මාර්තු 31 දින දක්වා ක්‍රියාත්මක වීමට නියමිතය.

# ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම ප්‍රකාශන ආධාර ව්‍යාපෘති මෙහෙයවීම හා පවත්වාගෙන යාම, මණ්ඩලයේ සියලුම ප්‍රකාශන පළ කිරීම, සම්භාව්‍ය සාහිත්‍ය කෘති සංස්කරණය, පරිවර්තනය හා ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යභාරය වේ. ඊට අමතරව අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතිය යටතේ ISBN/ISSN/ISMN අංක නිකුත් කිරීම හා විවිධ මට්ටමින් ලේඛක ප්‍රජාව වෙත ප්‍රකාශන කටයුතු පිළිබඳව උපදෙස් හා අනුග්‍රහය දැක්වීම මෙම අංශය යටතේ සිදුවේ.

## ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ 2015 වසරේ සිට 2018 වසර දක්වා මණ්ඩලය වෙත භාර දී තිබෙන අත්පිටපත්වල ඉදිරි කටයුතු මෙම වසරේ අවසන් කොට ඊට අදාළ ගිවිසුම් අත්සන් කිරීම සහ ලේඛකාධාර ලබාදීමේ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව අනුමත අත්පිටපත් 36ක් සඳහා කර්තෘවරු සමග ගිවිසුම් අත්සන් කිරීම 2020 ජනවාරි 27 හා මාර්තු 03 දිනවල දී සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ම මෙම වසරේ දී කර්තෘවරුන් 29 දෙනෙකු සඳහා ලේඛකාධාර වශයෙන් රු.2,109,902.00ක අනුග්‍රාහක ආධාර මුදලක් ලබාදීමට කටයුතු කොට තිබේ.

ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය වෙනුවෙන් නව අත්පිටපත් භාර ගැනීම සිදු කළ අතර, ඒ යටතේ ලේඛකයන් විසින් අත්පිටපත් 85ක් මණ්ඩලය වෙත භාර දී තිබේ. මෙම ව්‍යාපෘතියට අදාළ ව 2021 වර්ෂය සඳහා අත්පිටපත් භාරගැනීම 2020 ඔක්තෝබර් මස 02 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා ලේඛකයන් විසින් අත්පිටපත් 19ක් මණ්ඩලය වෙත භාර දී තිබේ. කෙසේ වුව ද ලැබී තිබූ අත්පිටපත් ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ හෙයින් අත්පිටපත් භාරගන්නා කාල සීමාව තවදුරටත් දීර්ඝ කරන ලදී.

## 2020 වර්ෂය තුළ ලේඛකාධාර ලබා දෙන ලද ග්‍රන්ථ පිළිබඳ තොරතුරු

| අනු අංකය | යොමු අංකය | විෂය ක්ෂේත්‍රය | කර්තෘ | ග්‍රන්ථ නාමය |
|---|---|---|---|---|
| 01 | 2016/28 | කෙටිකතා | කරුණා කුමාරසිංහ | මංගල ගමන |
| 02 | 2016/49 | ශාස්ත්‍රීය | විමලා දේවනාරායන | සාම්ප්‍රදායික හෙළ ගොවිතැන |
| 03 | 2016/59 | ශාස්ත්‍රීය | නන්දා වනසුන්දර | Mosaic of the Woman |
| 04 | 2016/168 | ශාස්ත්‍රීය | ආනන්ද දිසානායක | ජේම්ස් බොන්ඩ් සදා නොමියෙන සුපිරි රහස් දූතයා |
| 05 | 2016/184 | ශාස්ත්‍රීය | චින්තක රණසිංහ | හංසදීපනිය |
| 06 | 2017/37 | කෙටිකතා | ජී. ඒ. නාලිනී | Falk Tales of Ancient Sri Lanka |
| 07 | 2017/39 | කෙටිකතා | ආර්. එම්. අශෝකානන්ද | පෙම් හසුන සහ තවත් කතා |
| 08 | 2017/55 | කෙටිකතා | සම්පත් විජේවර්ධන | කඳුළු ඉවර නෑ |
| 09 | 2017/56 | ශාස්ත්‍රීය | ජී. ඩී. එස්. පෙරේරා | Fables of Esoft Age |
| 10 | 2017/71 | පද්‍ය | ජේ. ජේ. වික්‍රමසේන | කඳුළු සහ මී පැණි |
| 11 | 2017/74 | ගීත රචනා | ජයන්ත ග. ජෝතියරත්න | සිහින ඉවරයි |

| | | | | |
|---|---|---|---|---|
| 12 | 2017/100 | නවකතා | ඩී. බී. රම්බොඩගෙදර | සරස්වතීගේ දියණිය |
| 13 | 2017/105 | ශාස්ත්‍රීය | එම්. ඩබ්. ජිනදාස | විශ්මය ජනක මරණය |
| 14 | 2017/114 | පද්‍ය | තරංග ලක්මාල් ජයසූරිය | වාසිටි ගිය දුවට |
| 15 | 2017/131 | නවකතා | කේ. ජී. සිරිසේන | මිහිකත ගිනි ගනී |
| 16 | 2017/132 | කෙටිකතා | මල්කාන්ති පෙරේරා | ඔබයි මගේ සඳ |
| 17 | 2017/135 | කෙටිකතා | රණවීර වනසිංහ | තිමිරාංගනී |
| 18 | 2017/137 | පරිවර්තන | ශසිනි චන්ද්‍රසේකර | චම්පි |
| 19 | 2017/143 | ශාස්ත්‍රීය | N. Parthiepan | Arivulaham |
| 20 | 2017/157 | පද්‍ය | ඩබ්. එම්. ටී. එන්. වික්‍රමසිංහ | සඳකින්නරී |
| 21 | 2017/159 | පර්යේෂණ | කේ. කේ. ඊ. පෙරේරා | ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය සහ රබර් වගාව |
| 22 | 2018/05 | උපදේශාත්මක කතා | අතුල ආර්. පෙරේරා | දැනමුතු මුතු |
| 23 | 2018/09 | කෙටි කතා | සුමේධා නවරත්න | මාර්තාගේ දවස් කාල |
| 24 | 2018/10 | ශාස්ත්‍රීය | තුෂාර ධර්ම ශ්‍රී සෙනෙවිරත්න | රට සභාව හෙවත් වරිග සභාව |
| 25 | 2018/14 | කෙටි කතා | කාන්ති ලොකු නාරාංගොඩ | ඉලත්තට්ටුව |
| 26 | 2018/21 | පද්‍ය | H. L. Abdul Guthous | Ethaurayiru |
| 27 | 2018/29 | නවකතා | එස්. ශාන්ත දූනුකාර | බොරදිය |
| 28 | 2018/38 | විද්‍යා ප්‍රබන්ධ | ජයරත්න ඉහළ කොඩිප්පිලි | අගහරු ප්‍රත්‍යන්ත දේශය |
| 29 | 2018/43 | පද්‍ය | ආරියපාල රත්නායක | මතක ගිර බැස ගියෙමි |

## ළමා හා යොවුන් සාහිත්‍ය අත්පිටපත් ව්‍යාපෘතිය

ළමා හා යොවුන් සාහිත්‍ය අත්පිටපත් ව්‍යාපෘතිය යටතේ 2015 වසරේ සිට 2018 වසර දක්වා අත්පිටපත්වල ඉදිරි කටයුතු මෙම වසරේ අවසන් කොට ඊට අදාළ ගිවිසුම් අත්සන් කිරීම සහ ලේඛකාධාර ලබාදීමේ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව අනුමත අත්පිටපත් 25ක් සඳහා කර්තෘවරු සමග ගිවිසුම් අත්සන් කිරීම 2020 ජනවාරි 27 දින සිදු කරන ලදී. අනුමත අත්පිටපත් අතරින් කර්තෘවරු 20 දෙනෙකු සඳහා ලේඛකාධාර වශයෙන් රු.1,467,015.15ක අනුග්‍රාහක ආධාර මුදලක් ලබාදීමට කටයුතු කොට තිබේ. 2020 වසර සඳහා ළමා සහ යොවුන් සාහිත්‍ය අත්පිටපත් භාර ගැනීම සිදු කළ අතර, ඒ යටතේ අත්පිටපත් 37ක් මණ්ඩලය වෙත ලැබී තිබේ. මෙම අත්පිටපත් අතුරින් තෝරාගත් අත්පිටපත් 18ක් පමණක් සමීක්ෂණ කටයුතු සඳහා යොමු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ 2021 වසර වෙනුවෙන් අත්පිටපත් භාරගැනීම 2020 ඔක්තෝබර් මස 02 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වූ අතර, පසුව එහි කාලය 2021 මාර්තු මස 05 දින දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව ලද ළමා සහ යොවුන් සාහිත්‍ය අත්පිටපත් සංඛ්‍යාව 08කි.

## 2020 වර්ෂය තුළ ලේඛකාධාර ලබා දෙන ලද ළමා සහ යොවුන් සාහිත්‍ය කෘති පිළිබඳ තොරතුරු

| අනු අංකය | යොමු අංකය | විෂය ක්ෂේත්‍රය | කර්තෘ | ග්‍රන්ථ නාමය |
|---|---|---|---|---|
| 01 | 2018/J/01 | ළමා ප්‍රබන්ධ | ආර්. ඒ. එස්. ලාලනී | අපූරු පඹයා |
| 02 | 2018/J/07 | ළමා ප්‍රබන්ධ | ජේ. ඒ. එස්. එස්. ගුණවර්ධන | The Nightingale & Other Stories |
| 03 | 2017/J/09 | ළමා ප්‍රබන්ධ | එම්. ඩබ්. එම්. රසීනා | පූසි සහ නපුරු මැහැල්ල |
| 04 | 2018/J/10 | ළමා ප්‍රබන්ධ | අයිවන් අල්විස් | Blue Yellow and Green |
| 05 | 2018/J/11 | ළමා ප්‍රබන්ධ | සුනිල් ගොඩගේ | මල් වගේ ළමයි |
| 06 | 2018/J/12 | ළමා ප්‍රබන්ධ | ජේ. ඒ. නාලනී | කඩිසර කුඹිච්චී |
| 07 | 2017/J/15 | ළමා ප්‍රබන්ධ | සෝමා ජයකොඩි | අප්පච්චී පුතු නළවයි |
| 08 | 2017/J/31 | ළමා ප්‍රබන්ධ | සිරියලතා පරණවිතාන | කතිකාගේ චාරිකාව |
| 09 | 2017/J/36 | ළමා ප්‍රබන්ධ | එම්. ඩී. සී. පී. සපරමාදු | The Fairy & Samanala Kanda |
| 10 | 2017/J/37 | ළමා ප්‍රබන්ධ | චන්ද්‍රසේන කොඩිතුවක්කු | රන් සමනළ පැංචා |
| 11 | 2017/J/46 | ළමා ප්‍රබන්ධ | අනුර ශ්‍රී කුමාරි වීරසිංහ | කුඹි කුඹි කියන කතා |
| 12 | 2017/J/50 | ළමා ප්‍රබන්ධ | එම්. දයානි සිසිර කාන්ති | අනුන්ට කළ දේ තමන්ට පළ දේ |
| 13 | 2017/J/51 | ළමා ප්‍රබන්ධ | වී. නන්දා පෙරේරා | ඉරහාමිට මොකද උනේ |
| 14 | 2016/J/56 | ළමා ප්‍රබන්ධ | පද්මා මැණිකේ උඩවත්ත | මැජික් පැන |
| 15 | 2017/Y/008 | යොවුන් සාහිත්‍ය | අතුල ආර්. පෙරේරා | මුල්ලා නස්රුදීන් කතා |
| 16 | 2018/Y/08 | යොවුන් සාහිත්‍ය | ඩී. ඒ. පී. එස්. ගුණවර්ධන | බන්ටි |
| 17 | 2018/Y/11 | යොවුන් සාහිත්‍ය | කේ. එල්. පී. ඒ. රම්බිඩිගල | ආඩම්බරකාර පුතෙක් |
| 18 | 2017/Y/18 | යොවුන් සාහිත්‍ය | ඥානසේන පතිරණ | දිය ඇල්ලේ හපන්නු |
| 19 | 2017/Y/20 | යොවුන් සාහිත්‍ය | කුමාරි අබේගුණවර්ධන | පහන් එළියක් |
| 20 | 2017/Y/54 | යොවුන් සාහිත්‍ය | ඒ. එම්. පී. මුතුබණ්ඩා | රත්තරන් දුවක් |

J - ළමා ප්‍රබන්ධ Y – යොවුන් සාහිත්‍ය

## නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය

පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියැලෙන ලේඛක ලේඛිකාවන්ට අනුග්‍රහයක් දැක්වීමේ අරමුණෙන් ඔවුන් විසින් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන කෘතිවලින් සීමිත පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීම මේ යටතේ සිදුවේ. ඒ අනුව මණ්ඩලය වෙත භාර දී තිබූ මුද්‍රිත පිටපත් 329 අතුරෙන් උපදේශක කමිටු නිර්දේශ මත තෝරාගත් ප්‍රකාශන 97කින් පිටපත් මිල දී ගැනීමට කටයුතු කර තිබේ. ඒ වෙනුවෙන් ලේඛක ලේඛිකාවන් 97 දෙනෙකු වෙතින් රු. 364,837.00ක් වටිනා පොත් මිල දී ගැනීමට කටයු තිබේ.

## සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය කිරීම

### පන්සිය පනස් ජාතක පොත - දෙවන මුද්‍රණය

මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සම්භාව්‍ය කෘති සංස්කරණය කොට මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ **පන්සිය පනස් ජාතක** පොත සංස්කරණය කොට ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේ වුව ද එහි පළමු මුද්‍රණයේ පිටපත් අවසන් වීම මත එහි දෙවන මුද්‍රණයක් සිදු කිරීම සඳහා මණ්ඩලය කටයුතු කළ අතර, එම කෘතිය දෙවන මුද්‍රණයේ දී එහි පළමු මුද්‍රණයේ පැවති අක්ෂර වින්‍යාස දෝෂ සහ අනෙකුත් අඩුපාඩු සකස් කර ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන තිබේ. ඒ අනුව එහි හැඳින්වීම ද සහිතව කාණ්ඩ 05කින් සමන්විත පන්සිය පනස් ජාතක පොතෙහි දෙවන මුද්‍රණයෙහි කටයුතු මෙම වසරේ දී සම්පූර්ණ කිරීමට හැකි වී තිබේ.

## පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රකාශන පරිවර්තනයෙන් ප්‍රකාශයට පත් කිරීම

පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රකාශන දේශීය වශයෙන් ප්‍රචලිත කිරීමේ අරමුණින් මණ්ඩලය මගින් වාර්ෂිකව එම ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම හෝ ජාත්‍යන්තර වශයෙන් පළවන තෝරාගත් ප්‍රකාශන සිංහල හෝ දෙමළ භාෂාවට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කිරීම සිදු වේ. මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය **(IFLA)** මගින් ප්‍රකාශිත **Guidelines for Library Services to Prisoners (3rd edition)** කෘතිය **සිර කරුවන් සඳහා වූ පුස්තකාල පිළිබඳ මාර්ගෝපදේශ 3 වන සංස්කරණය** යනුවෙන් ආචාර්ය ප්‍රමිලා ගමගේ මෙනවිය විසින් පරිවර්තනය කළ අතර, එම කෘතිය මණ්ඩලයීය ප්‍රකාශනයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සිංහල පරිවර්තනය අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයට අයත් වෙබ් පිටුවෙහි ද පළ කොට තිබේ. (www.ifla.org)

## ප්‍රලේඛා සඟරාව

මණ්ඩලය මගින් ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රලේඛා සඟරාවෙහි 2019 ඔක්තෝබර්/ දෙසැම්බර් කලාපය **කවිය** තේමා කර ගනිමින් ප්‍රකාශයට පත් කරන ලද අතර 2020 වර්ෂයේ රටේ පැවති COVID-19 වසංගත තත්වය මත පැවති බාධා හේතුවෙන් 2020 පළමු කාර්තු දෙකට අදාළ ව එක් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී.

## නැට්නෙට් ලංකා (NATNET LANKA) පුවත් හසුන

පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ සිදුවීම් ඇතුළත් කර ප්‍රකාශයට පත් කරනු ලබන NATNET LANKA පුවත් හසුන අර්ධ වාර්ෂික ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් කළ ද පැවති COVID-19 වසංගත තත්වය හේතුවෙන් එක් කලාපයක් ලෙස මුද්‍රණය සඳහා සූදානම් කර තිබේ.

## අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN/ISSN/ISMN)

ශ්‍රී ලංකාව තුළ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන පොතපත ඇතුළු සියලු ප්‍රකාශන සඳහා අන්තර් ජාතික ප්‍රමිති අංක නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. ඒ අනුව සියලු ම පොත් සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) ද, සියලු ම වාර ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංකය (ISSN) ද, ප්‍රස්ථාර සහිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය (ISMN) ද නිකුත් කෙරේ.

## ප්‍රමිති අංක නිකුත් කිරීම සඳහා මාර්ගගත (Online) ගෙවීම් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියැලෙන ඕනෑම ප්‍රකාශකයෙකුට/ලේඛකයෙකුට තමන් සිටින ස්ථානයේ සිටම මාර්ගගතව නියමිත අයදුම්පත සම්පූර්ණ කර මුදල් ගෙවා ප්‍රමිති අංක ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ ක්‍රමයක් ලෙස මෙම ක්‍රමවේදය සැලසුම් කර තිබේ. මෙම මාර්ගගත පද්ධතිය සකස් කිරීම පෞද්ගලික මෘදුකාංග සංවර්ධනය කරන ආයතනයක් විසින් සකස් කරන ලද අතර, මුදල් ගෙවීමේ ක්‍රමවේදය (Payment Gateway) මහජන බැංකුව ඔස්සේ සිදු කිරීමට අදාළව 2020 ජුනි මස 02 දින ගිවිසුමකට එළඹී අතර, මීට අදාළ මෘදුකාංග සංවර්ධන ආයතනය සමග ගිවිසුමට එළඹීම 2020 ජුලි මස 03 දින සිදු කරන ලදී. මෙලෙස සංවර්ධනය කරන ලද මාර්ගගත ක්‍රමවේදය යටතේ ISBN, ISSN, ISMN අංක නිකුත් කිරීම 2020 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව www.isbn.lk වෙත පිවිසීමෙන් මෙම අන්තර්ජාතික ප්‍රමිති අංක මාර්ගගතව ලබා ගැනීමේ පහසුකම් සලසා දී තිබේ.

## අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය (ISBN)

මෙම වසරේ නොවැම්බර් මාසයේ සිට ISBN අංක සඳහා අයදුම් කිරීම හා නිකුත් කිරීම මාර්ගගතව සිදු කෙරෙන අතර ISBN අංක 7071ක් නිකුත් කර තිබේ. මේ සඳහා අලුතින් ලියාපදිංචි වූ ප්‍රකාශකයින් සංඛ්‍යාව 1020කි. මෙම ක්‍රමය යටතේ පොත් සඳහා අංක ලබාගත් ප්‍රකාශකයන් පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදු වේ. ISBN අංක ලබාගත් ප්‍රකාශකයින් විසින් ස්වේච්ඡාවෙන් ලබා දුන් කෘති 1201ක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත භාර දී තිබේ. ඒ අනුව මෙම අංක නිකුත් කිරීමෙන් මණ්ඩලය ලද වාර්ෂික ආදායම රු. 707,100.00කි.

## අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක ක්‍රමය (ISSN)

රටක් තුළ ප්‍රකාශයට පත්වන සියලු ම වාරික ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංකය (ISSN) නිකුත් කරණු ලැබේ. මෙම ප්‍රමිති අංකය නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරනු ලබන්නේ ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. මෙම වසරේ නොවැම්බර් මාසයේ සිට ISSN අංකය නිකුත් කිරීම ද මාර්ගගතව සිදු කරන ලද අතර මෙම වසර තුළ වාරික ප්‍රකාශන (මාලික ප්‍රකාශන) 165ක් සඳහා ISSN අංක නිකුත් කර තිබේ. මෙම අංක නිකුත් කිරීමෙන් මණ්ඩලය ලද වාර්ෂික ආදායම රු. 16,500.00කි.

## අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ව්‍යාපෘතිය (ISMN)

රටක් තුළ ප්‍රකාශයට පත්වන ප්‍රස්ථාර සහිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය (ISMN) නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය ලෙස කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. සෙසු ප්‍රමිති අංක මෙන්ම ISMN අංකය ද මාර්ගගතව නිකුත් කිරීම මෙම වසරේ නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වූ අතර, නිකුත් කළ ISMN අංක සංඛ්‍යාව 08කි. ඒ අනුව මෙම අංක නිකුත් කිරීමෙන් මණ්ඩලය ලද වාර්ෂික ආදායම රු. 800.00 කි.

## 2020 වර්ෂය තුළ ISBN, ISSN සහ ISMN නිකුත් කිරීම පහත පරිදි සිදු වී තිබේ.

| ප්‍රකාශක වර්ගය | ග්‍රන්ථ නාම සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ISBN | ISSN | ISMN |
| වාණිජ මට්ටමේ ප්‍රකාශකයින් | 3737 | 25 | 01 |
| රජයේ සහ රජයේ නො වන ආයතනික ප්‍රකාශකයින් | 1195 | 109 | 01 |
| කර්තෘ/පෞද්ගලික ප්‍රකාශකයින් | 2139 | 31 | 06 |
| එකතුව | 7071 | 165 | 08 |

### ග්‍රන්ථ පරිවර්තන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ වෙසෙන ජාතීන් අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණෙන් මෙන්ම ඒ ඒ භාෂාවලින් රචිත කෘති පිළිබඳව එකිනෙක ජාතීන්ට අවබෝධයක් ලබාදීමේ අරමුණෙන් මෙම ග්‍රන්ථ පරිවර්තන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. දෙවුන්දරතුඩුවේ සිට පේදුරුතුඩුවට සාහිත්‍ය පාලමක් මැයෙන් නම් කර තිබෙන මෙම ව්‍යාපෘතිය යටතේ දෙමළ භාෂාවෙන් රචිත තෝරාගත් කෙටිකථා කිහිපයක් සිංහල භාෂාවටත්, සිංහල භාෂාවෙන් රචිත තෝරාගත් කෙටිකථා කිහිපයක් දෙමළ භාෂාවටත් පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කරනු ලැබේ. මීට අදාළ කෙටි කතා හඳුනාගැනීම හා පරිවර්තන කටයුතු මෙම වසරේ දී සිදු කළ අතර, ඉදිරියේ දී මෙම කෘති මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලය අපේක්ෂා කෙරේ.

### මණ්ඩලයීය ප්‍රකාශන මුද්‍රණය කිරීම

මේ යටතේ මණ්ඩලය මගින් පහත සඳහන් පරිදි ප්‍රකාශන මුද්‍රණය කොට තිබේ.

| ප්‍රකාශනයේ නම | මුද්‍රිත පිටපත් සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2019/1 සිට 12 දක්වා කලාප | 2118 |
| වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව 2019/1 හා 2 කලාප | 156 |
| පශ්චාත් උපාධි නිබන්ධ අනුක්‍රමණිකාව | 103 |

## Kiyawamu.lk ව්‍යාපෘතිය

මාර්ගගත ක්‍රමය ඔස්සේ පාඨක ප්‍රජාව වෙත පොත් පත් කියවීමේ පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමග ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ තෝරාගත් කෘති විද්‍යුත් ප්‍රකාශන e-pub බවට පරිවර්තනය කර Kiyawamu.lk යෙදවුමට (Portal) ඇතුළත් කරනු ලැබේ. මෙම වසරේ ද හඳුනාගත් පොත් කිහිපයක් විද්‍යුත් ප්‍රකාශන බවට පරිවර්තනය කර මේ සඳහා ඇතුළත් කර තිබේ. ප්‍රකාශන හිමිකම් නීතියේ පවතින සීමා සහ සිංහල/දෙමළ භාෂාවෙන් පළවන කෘති විද්‍යුත් කෘති බවට පත් කිරීමේ දී පවතින තාක්ෂණික ගැටලු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණ තිබේ.

## "රටක් වටින පොතක්"පොත් 10,000 ලිවීමේ ජාතික වැඩසටහන

"රටක් වටින පොතක්" පොත් 10,000ක් ලිවීමේ ජාතික වැඩසටහන 2020 වසරේ අප්‍රේල් මස 09 දින එවකට අධ්‍යාපන අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ආරම්භ කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ ලොව පුරා පැතිර ගිය COVID - 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් 41 ලක්ෂයකට ආසන්න පාසල් සිසු සිසුවියන් තම නිවෙස්වල කාලය ගත කළ අතර ඔවුන් තුළ චිත්ත ශක්තිය හා අභියෝග ජය ගැනීමේ ශක්තිය වර්ධනය කර ගැනීමේ අරමුණින් මෙම වැඩසටහන දියත් කරන ලදී. මෙම පොත් ළමා කතාන්දර, පද්‍ය, රචනා, යොවුන් සාහිත්‍ය කෘති, කෙටි කතා, නවකතා, නාට්‍ය රචනා, පරිවර්තන, ඓතිහාසික කතා, මායා කතා, මිත්‍යා කතා, අභිරහස් කතා, උපමා කතා, ජන කතා, විද්‍යා ප්‍රබන්ධ, පරිසර විත්ති, ස්වයං චරිතාපදාන, සුරංග නා කතා, අතිශයෝක්ති කතා, ආගමික කතා, වීර කතා, විෂයානුබද්ධ සහ පුරාවෘත්ත ආදී වශයෙන් ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ රචනා කිරීමට අවස්ථාව ලබා දුනි. මෙලෙස පාසල් දරු දැරියන් විසින් රචනා කරනු ලබන කෘති පාසල් කමිටුවක් මගින් තෝරා කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් අධ්‍යාපන කාර්යාල මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම වසර තුළ ළමා අත්පිටපත් හඳුනාගැනීම සහ වර්ග කිරීමේ කටයුතු සිදු කළ අතර, මණ්ඩලයීය නිලධාරීන් මගින් මූලික වටයේ සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

# පුස්තකාල සහයෝගිතා අංශය

දේශීය හා විදේශීය පුස්තකාල සමඟ මෙන් ම ක්ෂේත්‍රයට අදාළ විවිධ ආයතන සමඟ අන්තර් සහයෝගිතාව පවත්වාගෙන යාම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. ඒ යටතේ ලෝකයේ විවිධ රටවල ජාතික පුස්තකාල හා වෙනත් ක්ෂේත්‍රයන්ට අයත් පුස්තකාල මෙන් ම අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය, යුනෙස්කෝ සංවිධානය ආදි සංවිධාන සමඟ සබඳතා පැවත්වීම සහ දේශීය වශයෙන් විවිධ පුස්තකාල, පුස්තකාල සංවිධාන හා සංගම් සමඟ සබඳතා පැවත්වීම ද පුස්තකාල සහයෝගිතා අංශයේ කාර්යභාරය වේ.

## ප්‍රකාශන හුවමාරු සේවාව

හුවමාරු සේවාව යටතේ දේශීය හා විදේශීය ආයතනවලින් ලැබෙන ප්‍රකාශන ජාතික පුස්තකාලය වෙත යොමු කරනු ලැබේ. ඒ අනුව 2020 වසර තුළ විදේශීය ආයතන 07ක් හා දේශීය ආයතනයක් මගින් ග්‍රන්ථ 09ක්, සඟරා 59ක් සහ සංයුක්ත තැටි (DVD – pack) 05ක් ලැබී තිබේ. මීට අමතරව ප්‍රකාශන හුවමාරු සේවාව යටතේ චීන ජාතික පුස්තකාලය වෙතින් ලද චීන භාෂාවෙන් රචිත පොත් 37ක් කැලණිය විශ්වවිද්‍යාලයේ නූතන භාෂා අධ්‍යයන අංශය වෙත පරිත්‍යාග කිරීමට කටයුතු කර තිබේ.

මෙම සේවාව යටතේ මණ්ඩලය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2019 පෙබරවාරි සිට ජුනි දක්වා කලාප ජපානය, කොරියාව, සිංගප්පූරුව, චීනය, තායිලන්තය, පාකිස්ථානය, බංග්ලාදේශය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, මලයාසියාව, මාලදිවයින, හොංකොං, රුසියාව, ස්විට්සර්ලන්තය, තුර්කිය සහ බ්‍රිතාන්‍ය යන රටවල ජාතික පුස්තකාල වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ.

තුර්කි ජන රජයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් කරන ලද ඉල්ලීමකට අනුව මෙරට ප්‍රකාශිත පහත සඳහන් ප්‍රකාශන එරට ජාතික පුස්තකාලය වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ.

- The Mahawamsa - the Great Chronicle of Ceylon– by Wilhelm Geiger; Published by Buddhist Cultural Center.
- Dhammapada – by Ven. Narada Thero; Published by Buddhist Cultural Center.
- The Prehistory of Sri Lanka: An Ecological Perspective – by S.U. Deraniyagala; Published by Department of Archaeology.
- Environment, Town, Village and Monastic Planning – by Roland Silva; Published by Department of Archaeology.
- Ancient Ceylon: The Journal of the Department of Archaeology, Sri Lanka : No. 25, July 2016 .
- Ancient Ceylon: The Journal of the Department of Archaeology, Sri Lanka : No. 24, July 2015.
- Ancient Ceylon: The Journal of the Department of Archaeology, Sri Lanka : No. 23, July 2012.
- History of the Kingdom of Rohana (From the Earliest to 1500 A.C.) – by SirimalRanawella; Published by Ministry of Higher Education and Department of Archaeology.

- The Faithful Foreigner: Thilo Hoffman, the Man who Saved Sinharaja – by Douglas B. Ranasinghe; Published by A. Baur & Co.
- A History of Sri Lanka – by K.M.de Silva.
- Collection of Drawings and Paintings – by L.K.Karunaratne.
- The Art of Mask Making in Sri Lanka – by Lionel Bentharage.

### ජාත්‍යන්තර සඟරා සඳහා දායකත්වය යාවත්කාලීන කිරීම

ජාත්‍යන්තර භූගෝල විද්‍යා සංගමය (National Geographic Society) මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන **National Geographic** මාසික සඟරාව සඳහා වාර්ෂික දායකත්වය අලුත් කිරීමට කටයුතු කර තිබේ. මාසිකව ප්‍රකාශයට පත්වන මෙම සඟරාවේ පිටපත් ජාතික පුස්තකාලයේ පාඨක පරිහරණය සඳහා යොමු කර තිබේ.

### ආයතනික සාමාජිකත්වය යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1993 වසරේ සිට අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) අඛණ්ඩ සාමාජිකයෙකු වන අතර, 2020 වසර වෙනුවෙන් ද එහි වාර්ෂික සාමාජිකත්වය යාවත්කාලීන කිරීම සඳහා පියවර ගෙන තිබේ.

### දත්ත පදනම් සාමාජිකත්වය යාවත්කාලීන කිරීම

නවදිල්ලි නගරයේ පිහිටි ඉන්දියානු ජාත්‍යන්තර මධ්‍යස්ථානය (India International Centre) මඟින් පවත්වාගෙන යනු ලබන DELNET (Development of Library Network) තොරතුරු ජාලයේ සාමාජිකත්වය ලබාගෙන තිබෙන අතර, මෙම තොරතුරු ජාලය තුළ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ ලිපි මෙන්ම වැදගත් තොරතුරු රාශියක් ඇතුළත් වේ. 2020 වසර සඳහා මෙම ජාලයේ වාර්ෂික දායකත්වය අලුත් කිරීම සහ දත්ත පදනම සඳහා ප්‍රවේශ පහසුකම් ලබාගැනීමට කටයුතු කර තිබේ.

### තොරතුරු ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර ජාල (Information Network) සමඟ සම්බන්ධ වීම

දේශීය වශයෙන් සංවිධානගත ජාල ලෙස සැලකෙන කෘෂි ක්ෂේත්‍රය හා සම්බන්ධ තොරතුරු ජාලය (AGRINET), සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ තොරතුරු ජාලය (HELLIS) වැනි තොරතුරු ජාල සමඟ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිරන්තර වශයෙන් සම්බන්ධතා පවත්වනු ලැබේ. මෙම තොරතුරු ජාල මඟින් ඒ ඒ ක්ෂේත්‍රවල විද්‍යාර්ථීන් සඳහා නවතම තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට පහසුකම් සැලසේ.

### වෙනත් ජාතික පුස්තකාලවල ප්‍රගති වාර්තා හා සැලසුම් ලබාගැනීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සංවිධාන ව්‍යුහය වැඩිදියුණු කර ගැනීමට උපකාර වන පරිදි ලෝකයේ වෙනත් රටවල ජාතික පුස්තකාල මගින් ප්‍රකාශිත වාර්ෂික ප්‍රගති වාර්තා සහ සැලසුම් ලබා ගැනීමට ද පියවර ගෙන තිබේ. ඒ යටතේ ඕස්ට්‍රේලියාව, සීෂෙල්ස්, සිංගප්පූරුව, මාලදිවයින, අයර්ලන්තය, නවසීලන්තය, ඉන්දියාව, ජපානය, පිලිපීනය, ඊශ්‍රායලය, වියට්නාමය සහ දකුණු කොරියාව යන රටවලින් එම වාර්තා ලබා ගැනීමට පියවර ගෙන ඇත.

## පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමඟ සහයෝගිතාව පවත්වාගෙන යාම

ශ්‍රී ලංකාවේ දැනට සබරගමුව, මධ්‍යම, ඌව සහ උතුරුමැද යන පළාත් සහා ආශ්‍රිතව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ක්‍රියාත්මක වේ. එහි කටයුතු සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබා දෙන අතර මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය කරනු ලබයි. මණ්ඩලයීය ප්‍රකාශන මෙම පළාත් පුස්තකාල සේවා මණ්ඩල වෙත යවනු ලබන අතර ඔවුන්ගේ වාර්ෂික සැලසුම් හා වාර්ෂික වාර්තා ද ගෙන්වා ගනු ලැබේ.

## පුස්තකාල ක්ෂේත්‍රයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම

පුස්තකාල ක්ෂේත්‍රයේ පවත්නා විවිධ ආයතනවල තනතුරු සඳහා බඳවා ගැනීමේ දී කිසියම් ඒකමිතියක් ඇති කිරීමේ අරමුණින් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබේ. ඊට අදාළ මූලික සැලසුම් සකස් කිරීම සඳහා විවිධ ආයතන සහ පුස්තකාල වෘත්තීය සංගම්වල නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා එහි මූලික සැලැස්මක් සකස් කර තිබේ.

## වෙනත් සහයෝගීතා වැඩසටහන්

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් හා මහජන පුස්තකාල ක්ෂේත්‍රයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධ ගැටලු පිළිබඳව අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීම සඳහා පියවර ගෙන තිබේ. ඊට අමතරව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ පවත්නා ගැටළු සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර විසඳුම් යෝජනා කර තිබේ.

## පුස්තකාල ශ්‍රේණිගත කිරීම

ශ්‍රී ලංකාවේ සියලුම පුස්තකාල සඳහා ප්‍රමිති සම්පාදනය කිරීම සහ එම ප්‍රමිතිවලට අනුකූලව පුස්තකාල ශ්‍රේණිගත කිරීම මණ්ඩලයේ එක් ප්‍රධාන වගකීමකි. ඒ අනුව මෙම වසරේ පහත සඳහන් පුස්තකාල ශ්‍රේණිගත කිරීමට පියවර ගෙන තිබේ.

| | පුස්තකාලයේ නම | අධිකාරී ආයතනය | ලබා දුන් ශ්‍රේණිය | ශ්‍රේණිගත කළ දිනය |
|---|---|---|---|---|
| 01 | කුලියාපිටිය කාර්මික විද්‍යාල පුස්තකාලය | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 02 | තෙලිජ්ජවිල මහජන පුස්තකාලය | තෙලිජ්ජවිල ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 03 | ශ්‍රී ගුණානන්ද මහජන පුස්තකාලය | බලපිටිය ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 04 | ඔඩ්ඩමාවඩි මහජන පුස්තකාලය | කොරළේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 05 | හක්මන මහජන පුස්තකාල | හක්මන ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 06 | මැදගම ආර්. ඒ. එම්. ගුණසේකර මහජන පුස්තකාලය | මැදගම ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |
| 07 | දියතලාව මහජන පුස්තකාලය | දියතලාව ප්‍රාදේශීය සභාව | ii ශ්‍රේණිය | 2020.07.21 |

ජාතික පාසල් පුස්තකාලවල ශ්‍රේණිගත කිරිම් පිළිබඳ විස්තර ලබාගැනීම සඳහා සකස් කළ ප්‍රශ්නාවලිය ජාතික පාසල් 250ක් වෙත යොමු කිරීමට කටයුතු කළ අතර එම ප්‍රශ්නාවලිය දෙමළ භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට කටයුතු කර තිබේ. ඊට අමතරව නීතිපති දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ශ්‍රේණිය උසස් කිරීම සඳහා නිරීක්ෂණය කිරීමට කටයුතු කිරීමත්, තුන්වන ශ්‍රේණියේ පුස්තකාල සඳහා අදාළ නිර්ණායක සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් කෙටුම්පත් කිරීමටත් පියවර ගෙන ඇත. ශ්‍රේණිගත කිරීම සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සංශෝධනය සඳහා කටයුතු සිදු කර තිබේ. මහජන හා පාසල් පුස්තකාල ප්‍රමිති සංශෝධනය කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබේ. තව ද ජාතික පාසල් 274ක් පිළිබඳ තොරතුරු දත්ත පදනමට ඇතුළත් කිරීම සිදු කර ඇත. දැනට ශ්‍රේණිගත කොට තිබෙන පුස්තකාල ලැයිස්තුව (දිස්ත්‍රික් මට්ටමෙන් සකස් කොට) කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ.

# ක්‍රමෝපාය සැලසුම් අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලුම අංශවල කටයුතු සැලසුම් කිරීමට දායකවීම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ක්‍රමෝපාය සැලසුම් අංශය මගින් ඉටු කෙරේ. මීට අමතරව පාලන කටයුතු විධිමත් පරිදි කරගෙන යාම සඳහා අවශ්‍ය සහාය ලබාදීම ද මෙම අංශයේ වගකීම වේ. ආයතනයේ විවිධ අංශවල ප්‍රගති වාර්තා ඇසුරෙන් වාර්ෂික, අර්ධ වාර්ෂික හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම, මාසිකව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම ද අංශයේ කාර්යභාරය වේ. ඊට අමතරව විදේශගතවන මණ්ඩලයීය නිලධාරීන් සඳහා අවශ්‍ය කටයුතු කිරීම ගුවන් ප්‍රවේශ පත්‍ර, වීසා ලබාගැනීම ආදී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම ද ක්‍රමෝපාය සැලසුම් අංශය මගින් සිදු කෙරේ.

## ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම

මෙම වසරේ රටේ පැවැති COVID - 19 වසංගත තත්වය හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම මත සෑම මසකම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අපොහොසත් වූව ද 2020 වසර තුළ සියලු ම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ඒ ඒ අංශවල ප්‍රගතිය විමසා බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් 09ක් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් සංවිධානය කර තිබේ.

## වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, මාසික ප්‍රගති වාර්තා හා වාර්ෂික වාර්තා සම්පාදනය

2020 වසර සඳහා ක්‍රියාකාරී සැලස්ම සකස් කළ අතර මාසිකව ප්‍රගති වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කර තිබේ. වාර්ෂික වාර්තා සම්පාදනය යටතේ 2016 සහ 2017 වසරවල වාර්ෂික වාර්තා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී තිබේ. මෙයට අමතරව 2018 වසරේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ද සකස් කර තිබේ.

## විදේශ පුහුණුවීම් හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් යොමු කිරීම

- 2020.02.06 - 13 දක්වා ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ පැවැත්වූ නැගී එන පුස්තකාල නවෝත්පාදකයින්ගේ ජාල සහ දකුණු ආසියානු ගෝලීය පුස්තකාල නායකත්ව ධාරිතා වර්ධන වැඩසටහන සඳහා ව්‍යාප්ති සේවා අංශයේ සහකාර අධ්‍යක්ෂ කුසලා සජීවනී මහත්මිය සහභාගී කරවීමට අදාළ කටයුතු සංවිධානය කිරීම.
- 2020.02.17 - 20 දක්වා ඉන්දුනීසියාවේ පැවැත්වීමට නියමිතව පැවති ආසියා හා ශාන්තිකර සාගර කලාපීය රටවල ජාතික පුස්තකාල අධ්‍යක්ෂවරුන්ගේ 28වන සමුළුව සඳහා අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්. සුනිල් මහතා සහභාගී කරවීමට කටයුතු සංවිධානය කළ ද ගෝලීය වශයෙන් බලපැවැත් වූ COVID - 19 වසංගත තත්වය හේතුවෙන් එම සමුළුව තාවකාලිකව කල් දැමීම මත ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහභාගීවීමට නොහැකි වුණි.

# පරිපාලන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම පරිපාලන කටයුතු පරිපාලන අංශය යටතේ සිදු වේ. මේ යටතේ සේවක බඳවා ගැනීම්, සේවක නිවාඩු, වැටුප් ණය හා අත්තිකාරම් ලබාදීම, වාහන පාලනය, ගබඩා කටයුතු පාලනය, ආරක්ෂක කටයුතු සංවිධානය හා අධීක්ෂණය, ලේඛනාගාර කළමනාකරණය (Record Room Management), වාර්ෂික තොග සමීක්ෂණ ආදිය සිදු කෙරේ.

## සාමාන්‍ය පරිපාලන කටයුතු

ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබාදීමට කටයුතු කිරීම, ආරක්ෂක සේවා පිළිබඳ කටයුතු, විදේශ පාර්සල් නිරවුල් කිරීම, සේවක සුබ සාධනය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය, වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම්, නිවාඩු ලේඛන යාවත්කාලීන කිරීම, සාමාන්‍ය/ලියාපදිංචි ලිපි තැපෑලට යොමු කිරීම, මණ්ඩලයේ සේවා නිල ඇඳුම් ලබාදීම, නිල හැඳුනුම්පත් ලබාදීම, තොග සමීක්ෂණය, ගබඩා පාලනය හා ආයතනයේ සියලු ම පරිපාලන කටයුතු නිසි පරිදි පවත්වාගෙනයාමට පියවර ගෙන තිබේ.

## කාර්ය මණ්ඩලයේ ශ්‍රේණි සහ තනතුරු උසස් කිරීම්/විශ්‍රාම ගැනීම්

මෙම වසරේ මණ්ඩලයේ අභ්‍යන්තර තනතුරු උසස්වීම් යටතේ කළමනාකරණ සහකාර iii ශ්‍රේණියේ තනතුරක් ද, ශ්‍රේණි උසස්වීම් යටතේ තොරතුරු සහකාර i ශ්‍රේණිය සඳහා නිලධාරීන් 08ක් ද, කළමනාකරණ සහකාර i ශ්‍රේණිය සඳහා නිලධාරීන් 03ක් ද, පුස්තකාල සහායක i ශ්‍රේණිය සඳහා නිලධාරීන් 05ක් සහ රියදුරු i ශ්‍රේණිය සඳහා එක් උසස්වීමක් ලබා දී තිබේ. මෙම වසර තුළ එක් සේවකයෙක් විශ්‍රාම ගොස් තිබෙන අතර, සේවකයින් 06 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් තිබේ.

## ආයතනයේ ව්‍යුහමය තත්වයන් වර්ධනය කිරීම/විභාග කටයුතු

වාර්ෂිකව පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම යටතේ මෙම වසර තුළ තනතුරු කිහිපයක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට මූලික කටයුතු සිදු කිරීම.

| තනතුර | කාර්යක්ෂමතා කඩඉම | අයදුම් කළ සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ ii | i | 03 |
| පරිපාලන නිලධාරී ii | i | 01 |
| තොරතුරු සහකාර iii | i | 05 |
| තොරතුරු සහකාර i | iii | 02 |
| කළමනාකරණ සහකාර iii | i | 03 |
| කළමනාකරණ සහකාර i | iii | 04 |
| කාර්යාල සහායක iii | i | 06 |
| පුස්තකාල සහායක i | iii | 01 |

# නඩත්තු අංශය

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදුවන බැවින් එම කටයුතු අධීක්ෂණය කිරීම හා අදාළ රැස්වීම් පැවැත්වීමට කටයුතු කර තිබේ. කාර්යාල උපකරණ සඳහා නඩත්තු ගිවිසුම් අත්සන් කිරීම හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම. භාවිතයට ගත නොහැකි උපකරණ අපහරණය සඳහා යොමු කිරීම සහ නවීකරණය කරන ලද කොටස සඳහා අවශ්‍ය ලී බඩු ලබාගැනීමට අවශ්‍ය කාර්යයන් සිදු කිරීම, මෝටර් රථ නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු අවශ්‍යතා පරිදි සිදුකර තිබේ. උද්‍යාන නඩත්තු කටයුතු සිදු කිරීම සහ ඊට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබාගැනීමට කටයුතු කිරීම හා මණ්ඩලයීය ගොඩනැගිල්ල අදාළ බාහිර ආයතනය මගින් දිනපතා පිරිසිදු කිරීමට පියවර ගෙන තිබේ. දුරකථන, විදුලි, ජල හා අන්තර්ජාල බිල්පත් ගෙවීමට කටයුතු කිරීම සහ වසර අවසානයේ දේපළ රක්ෂණය සඳහා අදාළ කටයුතු යොදා තිබේ. 2020 වසරේ ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණ ශාලාව කුළියට ලබාදීම මගින් රු.865,000.00ක ආදායමක් උපයා ගෙන තිබේ.

මීට අමතරව මණ්ඩලයීය ඉඩම නිදහස් දීමනා බලපත්‍රයක් මඟින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීමට පියවර ගෙන තිබේ. අභ්‍යන්තර නවීකරණ කටයුතු සිදුවන  බැවින් අවස්ථානුකූලව ගොඩනැගිල්ලේ ඇතිවන නඩත්තු කටයුතු සිදු කිරීම, නවීකරණ කටයුතුවල දී අපහරණ කළ යුතු භාණ්ඩ මිල ගණන් කැඳවා වෙන්දේසි කිරීම, අවශ්‍යතා පරිදි අදාළ කමිටු රැස් කොට අවශ්‍ය ස්ථානවලින් භාණ්ඩ ඉවත් කර අලුත්වැඩියා කටයුතු සඳහා ඉඩ පහසුකම් ලබාදීමට පියවර ගෙන තිබේ. මණ්ඩලයීය නව ගොඩනැගිල්ල සැකසීම සඳහා සැලසුම් හා ප්‍රමාණ බිල්පත් සැකසීම හා නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් ලබාගැනීම, නවීකරණය කරන ලද කොටස සඳහා අවශ්‍ය ලීබඩු ලබාගැනීමට ප්‍රමාණ බිල්පත් සැකසීම හා ඊට අදාළ කටයුතු සිදු කර තිබේ.

# මුදල් අංශය

2020 වර්ෂයට අදාළ අයවැය ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර තිබේ. මාසිකව පිළියෙල කළ මුදල් පුරෝකථන වාර්තා, ලැබීම් හා ගෙවීම් විස්තර ඇතුළත් කර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගත් අතර, මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නියමිත පරිදි ලබාගැනීම සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ විස්තර ඇතුළත් මුදල් පුරෝකථන වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට පියවර ගෙන තිබේ. මෙයට අමතරව මණ්ඩලයේ ලැබීම් හා ගෙවීම්, මුදල් පොත් පරිගණකගත කරන ලද අතර මාසික වාර්තා හා අවසන් ගිණුම් වාර්තා පිළියෙල කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණ වාර්තා පිළියෙල කර තිබේ. මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද මුදල් හා මණ්ඩලයේ ඉපයීම් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් කිරීම සඳහා ද උපයෝගී කර ගන්නා ලද අතර, රජයේ විගණන අංශයෙන් ලැබුණු විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමත්, සියලුම බැංකු ගිණුම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් මුදල් පොත් මාසිකව යාවත්කාලීනව පවත්වාගෙන යාමට ද කටයුතු කර තිබේ.

සේවක වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් දීමනා යනාදි ගෙවීම් කටයුතු නියමිත දිනවල දී සිදු කරන ලදී. පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නිසි පරිදි නො ලැබුණු අවස්ථාවල දී මණ්ඩලය විසින් උපයන ලද මුදල් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් සඳහා යොදාගෙන තිබේ. ලැබීම් ගෙවීම් පිළිබඳ විස්තර සහිතව මුදල් පුරෝකථන වාර්තාව පිළියෙල කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මාසිකව ඉදිරිපත් කර මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලබාගැනීමට කටයුතු කරන ලදී. මණ්ඩලයට ලැබෙන අනෙකුත් ආදායම් නිසි පරිදි ලබාගැනීමට පියවර ගැනීමත්, මාසික ගිණුම් වාර්තා සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ. මෙයට අමතරව ලැබීම් හා ගෙවීම් මුදල් පොත් පරිගණකගත කරන ලද අතර, එම තොරතුරු ආශ්‍රයෙන් බැංකු සැසඳුම් වාර්තා හා අවසන් ගිණුම් ලිපිගොනු යාවත්කාලීන කර තිබේ.

මෙම වර්ෂයට අදාළව මාසික වැටුප් වාර්තා සකස් කිරීම, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා ව්‍යවස්ථාපිත අඩු කිරීම් සඳහා වාර මුදල් ගෙවීම් කටයුතුත්, අවකරණ ලේඛන සකස් කිරීම, ණය ලේඛන යාවත්කාලින කිරීම, 2018 වර්ෂය අවසාන ගිණුම් වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම. 2019 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාවේ කෙටුම්පත සැකසීම. අවශ්‍ය වැටුප් විස්තර, ඇප තැන්පතු හා අනෙකුත් තොරතුරු ලබාදීම, සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල 2019 අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම යනා දී කටයුතු මේ යටතේ සිදු කර තිබේ. මෙයට අමතරව මණ්ඩලයීය අවශ්‍යතා සඳහා ලිපිද්‍රව්‍ය සැපයීමත්, අලෙවිහල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, පොත් බැඳුම්හල සඳහා අවශ්‍ය උපකරණ කට්ටල හා රසායනික ද්‍රව්‍ය සැපයීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

## ප්‍රසම්පාදන කටයුතු

ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා රු. 1,267,750.00ක් ද, ජාතික පුස්තකාලය සඳහා පොත්පත් මිල දී ගැනීම සඳහා රු. 524,283.00ක් ද, පරිගණක හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.805,500.00ක් ද, ග්‍රාමීය පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.527,754.00ක මුදලක් ද 2020 වසර තුළ වැය කර තිබේ.

# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයීය මුදල් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව හා ලංකා බැංකුවට අදාළ දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්, කුවිතාන්සි හා බැංකු තැන්පතු පත් පරීක්ෂා කිරීම, ගෙවීම් වවුචර සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම, අත්තිකාරම් ගෙවීම් සහ පියවීම් පරීක්ෂා කිරීම, වැටුප් අවකරණ යටතේ ආපදා ණය ගෙවීම්වලට අදාළ ලේඛන පරීක්ෂා කිරීම, බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි නිවැරදිභාවය පරීක්ෂා කිරීම, මණ්ඩලයීය නිලධාරීන්ගේ වැටුප් ගෙවීම්වලට අදාළ ලිපිගොනු හා වැටුප් ලේඛන පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

2020 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයීය මුදල් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව ටවුන්හෝල් හා ලංකා බැංකුවට අදාළ 2020 වර්ෂයේ ජනවාරි සිට ජූලි මස දක්වා දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්, කුවිතාන්සි පරීක්ෂා කිරීම සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් 01ක් නිකුත් කර ඇත. මහජන බැංකුව ටවුන්හෝල් සහ ලංකා බැංකුවට අදාළ 2020 වර්ෂයේ ජනවාරි සිට ජූලි මස දක්වා ගෙවීම් වවුචර්පත් සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම සිදුකර අභ්‍යන්තර විගණන විමසුම් 01ක් නිකුත් කර ඇත.

එමෙන්ම රජයේ විගණන අංශය මඟින් විගණන විමසුම් 05ක් සහ විගණකාධිපති වාර්තා 01ක් යොමු කර ඇති අතර, ඒ සඳහා පිළිතුරු වාර්තා සැපයීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර තිබේ. මෙම වසර තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් සංවිධානය කළ අතර, පැවති COVID - 19 වසංගත තත්වය හේතුවෙන් නියමිත රැස්වීම් සංඛ්‍යාව සංවිධානය කළ නොහැකි විය.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

(අධ්‍යාපන අමාත්‍යාංශය)

# ගිණුම් වාර්තාව - 2020

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | 31.12.2020 (රු.) | 31.12.2019 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | සටහන | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 13,818,978.00 | 10,766,828.00 |
| ලැබිය යුතු දෑ | 2 | 14,853,670.00 | 14,442,008.00 |
| තොගය | 3 | 16,445,512.00 | 16,624,477.00 |
| කලින් ගෙවීම් | 4 | 1,734,355.00 | 854,835.00 |
| තැන්පතු | 5 | 385,716.00 | 361,942.00 |
| | | **47,238,231.00** | **43,050,090.00** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 51,493,522.00 | 54,144,090.00 |
| ඉඩම සහ ගොඩනැගිලි | 7 | 106,158,477.00 | 108,880,489.00 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 8 | 41,237,807.00 | 45,274,294.00 |
| | | **198,889,806.00** | **208,298,873.00** |
| වත්කම් එකතුව | | **246,128,037.00** | **251,348,963.00** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වියදම් | 9 | 1,603,960.00 | 4,724,284.00 |
| උපචිත වියදම් | 10 | 5,563,126.00 | 9,581,712.00 |
| සේවක ප්‍රතිලාභ | 11 | 340,716.00 | 314,942.00 |
| වෙනත් ජංගම වගකීම් | 12 | 1,521,852.00 | 754,612.00 |
| | | **9,029,654.00** | **15,375,550.00** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 45,578,972.00 | 38,975,663.00 |
| **වගකීම් එකතුව** | | **54,608,626.00** | **54,351,213.00** |
| **ශුද්ධ වත්කම්** | | **191,519,411.00** | **196,997,750.00** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | |
| ප්‍රාග්ධන / වෙනත් අනුග්‍රාහක ආධාර | 13 | 7,030.00 | 7,030.00 |
| සංචිත | 14 | 3,138,634.00 | 959,147.00 |
| සමුච්චිත අතිරික්තය / (හිඟය) | 15 | 188,373,747.00 | 196,031,573.00 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **191,519,411.00** | **196,997,750.00** |

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර තිබේ.**

-----------------------------------------------

අධ්‍යක්ෂ (මුදල් හා පාලන)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කරනු ලැබේ.

| | |
|---|---|
| ---------------------------------------------- | ---------------------------------------------- |
| අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| ජා. පු. හා ප්‍ර. සේ. ම. | ජා. පු. හා ප්‍ර. සේ. ම. |

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන විස්තරය

| | සටහන | 31.12.2020 (රු.) | 31.12.2019 (රු.) |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පොත් අලෙවි හලේ වෙළඳ ගිණුම | 16 | 804,042.00 | 2,755,085.00 |
| ශ්‍රවණාගාර කුලිය | | 828,000.00 | 561,045.00 |
| කුලී හා පාඨක ආදායම | 17 | 2,310,513.00 | 3,006,065.00 |
| පොලී ආදායම් | 18 | 502,457.00 | 557,543.00 |
| ප්‍රකාශන දායකත්වය ආදායම | 19 | 440,408.00 | 916,487.00 |
| වෙනත් ආදායම් | 20 | 891,490.00 | 1,772,227.00 |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 144,300,000.00 | 138,700,000.00 |
| ප්‍රාග්ධන ස්වරූපයේ පුනරාවර්තන වියදම් | | - | 2,162,277.00 |
| වෙනත් ප්‍රතිපාදන -විදේශීය ප්‍රදාන/ ආධාර | | 153,560.00 | - |
| ආදායම් එකතුව | | **150,230,470.00** | **150,430,729.00** |
| **වියදම්** | | | |
| පුස්තකාල සේවා වියදම් | 21 | 7,322,457.00 | 13,286,101.00 |
| පරිපාලන හා ආයතනික වියදම් | 22 | 153,958,393.00 | 148,584,176.00 |
| මූල්‍ය පිරිවැය | 23 | 20,410.00 | 33,112.00 |
| වියදම් එකතුව | | **161,301,260.00** | **161,903,389.00** |
| අදාළ කාලය සඳහා අතිරික්තය (හිඟය) | | **(11,070,790.00)** | **(11,472,678.00)** |
| **වෙනත් ආදායම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ අලෙවි ලාභය/ (පාඩුව) | | (887,251.00) | 14,235.00 |
| දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභය/ (පාඩුව) | | (5,661.00) | (6,657.00) |
| **අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය)** | | **(11,963,702.00)** | **(11,465,100.00)** |

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

රු. 000

| | සමුච්චිත අරමුදල | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | වෙනත් ආස්තීත්-වයෙන් ලද ප්‍රාග්ධන දායකත්ව ප්‍රදාන |
|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 194,486 | 2,882 | **7** |
| පූර්ව වර්ෂ ගැලපීම් | - | - | **-** |
| 2018.12.31 දිනට ගලපන ලද ශේෂය | **194,486** | **2,882** | **7** |
| වසර තුළ ගැලපීම් | - | - | - |
| ශුද්ධ අතිරික්තය /(හිඟය) | (11,465) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන | - | 13,250 | - |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම | 13,010 | (13,010) | - |
| ප්‍රාග්ධන ස්වරූපයේ පුනරාවර්තන වියදම් | - | (2,162) | |
| 2019.12.31 දිනට ශේෂය | 196,031 | 960 | 7 |
| පූර්ව වර්ෂ ගැලපීම | 80 | - | **-** |
| 2019.12.31 දිනට ගලපන ලද ශේෂය | **196,111** | **960** | **7** |
| ශුද්ධ අතිරික්තය / (හිඟය) | (11,964) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන | - | 6,405 | - |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම | 4,226 | (4,226) | - |
| **2020.12.31 දිනට ශේෂය** | **188,373** | **3,139** | **7** |

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | | 31.12.2020<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය / (හිඟය) | | (11,963,702.00) |
| **ගැලපීම්** | | |
| - ක්ෂය කිරීම | 12,787,062.00 | |
| | 12,787,062.00 | |
| ලාභය/ (පාඩුව) දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීම | 892,912.00 | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 7,383,974.00 | |
| | | 21,063,948.00 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | 9,100,246.00 |
| (වැඩිවීම) /අඩුවීම තොගයේ | 178,965.00 | |
| (වැඩිවීම) /අඩුවීම ලැබිය යුතු දෑ | (411,662.00) | |
| (වැඩිවීම) /අඩුවීම පූර්ව ගෙවීම් | (879,520.00) | |
| (වැඩිවීම) /අඩුවීම තැන්පතු | (23,774.00) | |
| (වැඩිවීම) /අඩුවීම ගෙවිය යුතු දෑ | (3,030,824.00) | |
| (වැඩිවීම) /අඩුවීම උපචිත වියදම් | (4,018,587.00) | |
| (වැඩිවීම) /අඩුවීම සේවක ප්‍රතිලාභ | 25,774.00 | |
| (වැඩිවීම) /අඩුවීම වෙනත් ජංගම වගකීම් | 767,240.00 | (7,392,388.00) |
| **මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මුදල** | | **1,707,858.00** |
| විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් | | (780,665.00) |
| මෙහෙයුම් කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | | **927,193.00** |
| **ආයෝජන කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 6,405,000.00 | |
| වසර තුළ ආයෝජන | - | |
| දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම | (4,315,013.00) | |
| දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීම් සඳහා මූල්‍යමය ලැබීම | 34,970.00 | |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | **2,124,957.00** |
| මූල්‍ය කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහ | - | |
| දිගුකාලීන ණය කරුවන්ට නැවත ගෙවීම | | - |
| මූල්‍ය කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | | |
| ශුද්ධ වැඩිවීම / (අඩුවීම) මූල්‍ය හා මූල්‍ය සමාන දෑ | | 3,052,150.00 |
| වසර ආරම්භයේ දී බැංකු ශේෂය | | 10,766,828.00 |
| වසර අවසානයේ දී මූල්‍ය හා මූල්‍ය සමාන දෑ | | **13,818,978.00** |
| 2020.12.31 දිනට බැංකුවේ මුදල | | **13,818,978.00** |

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතට අනුව පිහිටුවන ලද මෙම ආයතනය 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත බවට සංශෝධනය විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ලෙස රට තුළ පුස්තකාල සේවා සංවර්ධනය කිරීම වෙනුවෙන් සැලසුම් සැකසීම හා ආධාර කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාම, මහජන පුස්තකාල හා පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම වෙනුවෙන් උපදෙස් හා ආධාර දීම, කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම, ග්‍රන්ථ සංවර්ධනය හා ප්‍රලේඛන කටයුතු සඳහා අතහිත දීම ආදිය වේ. ආයතනයේ ලියාපදිංචි ලිපිනය අංක 14, නිදහස් මාවත, කොළඹ 07 වේ.

### 01 <u>පොදු</u>

### 01.01 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

අ) මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් විස්තර සහ අයවැයගත හා සත්‍ය වියදම් විචලන ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රි.ල.රා.ගි.ප්‍ර) අනුව සකස් කර ඇත.

ආ) ඓතිහාසික වටිනාකම් අගයන්ට යටත්ව මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

ඇ) මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී උද්ධමනීය සාධක ගලපා නොමැත.

ඈ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න රුපියලට සකස් කරන ලදී.

ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ඊ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ සංකල්පයට අනුව පිළියෙල කර තිබේ.

### 01.02 <u>සංසන්දනාත්මක තොරතුරු</u>

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව අනුගමනය කරන ලද අතර පසුගිය වසරේ අගයන් හා ප්‍රකාශ අනුරූපීව අවශ්‍ය පරිදි නැවත ගලපමින් පවත්නා වසරට ඉදිරිපත් කරන ලදී.

### 01.03 නොවෙනස්ව ඉදිරිපත් කිරීම

2020 දී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සහ අයිතම වර්ගීකරණය කිරීමේ වෙනස් කිරීමක් සිදු කර නොමැත

### 02 <u>වත්කම් හා ඒවායේ තක්සේරු පදනම</u>

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වත්කම් ජංගම ලෙස වර්ග කර ඇත්තේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියට අනුව වර්ෂයක් තුළ දී හෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක් ඇතුළත දී මුදල් හෝ මුදල් හා සමාන දෑ බවට පත්වන දෑ වේ.

## 02.01 දේපළ, පිරියත හා උපකරණ සහ ක්ෂයවීම

### 02.01.01 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම පෙන්වා දී ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට ය. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ගණනය කර ඇත්තේ ඒවා මිල දී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ එම වත්කම් වර්තමාන තත්වයට ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ද ඇතුළත්වය.
සපයනු ලබන සේවා ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් වත්කම් අත්පත් කර ගැනීමේ, අලුත්වැඩියා කිරීමේ සහ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ස්ථිර ස්වභාවයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී.

### 02.01. 02 ක්ෂයවීම

හීනවන ශේෂ ක්‍රමය අනුව ස්ථාවර වත්කම්----- රේටයන් පහත සඳහන් පරිදි ක්ෂය කිරීම් කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිල්ල | 2.5% |
| මෝටර් රථ | 10% |
| කාර්යාලයීය ලී බඩු හා උපකරණ | 10% |
| පරිගණක හා පරිගණක උපාංග | 10% |
| පුස්තකාල උපකරණ | 10% |
| පොත් බැඳුම් උපකරණ | 10% |
| ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ | 10% |
| පිරියත හා යන්ත්‍ර | 10% |
| පොත් තොගය (ජාතික පුස්තකාලය) | 10% |
| සංඛ්‍යාංක සංචිතය (ජාතික පුස්තකාලය) | 10% |
| Kiyawamu.lk | 10% |

2014.01.01 දිනට පෙර මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම්, ඒවායේ ඉතිරි ඵලදායි ආයු කාලය පුරාවට ක්ෂය වීම් ගණනය කරන ලද මිලදීගත් /අත්පත්කර ගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වෙන් නොකරන ලදී. වත්කම් බැහැර කරන විට සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂයවීම් වෙන් කරන ලදී. 2014.01.01 දිනට පසු ජාතික පුස්තකාල පොත් තොගය හැර මිලදීගත් /අත්පත්කරගත් ස්ථාවර වත්කම් ඒවා මිලදීගත් / අත්පත් කර ගත් දිනය පදනම් කර ගෙන ක්ෂය වීම් වෙන් කරයි. 2014.01.01 දිනට පසුව මිලදී ගත් ජාතික පුස්තකාල පොත් තොගය, ඒවා මිලදීගත් / අත්පත් කර ගත් මාසය පදනම් කරගෙන ක්ෂවීම් වෙන් කරනු ලැබේ.

## 02.02 ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කිරීම

ස්වාධීන තක්සේරුකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ජාතික පුස්තකාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල 1995 නොවැම්බර් 16 දිනට පහත පරිදි තක්සේරු කරනු ලැබීය.

| | |
|---|---|
| ඉඩම (පර්චස් 318ක්, එකක් රු. 8,000,000.00 බැගින්) | රු. 254,400,000.00 |
| ගොඩනැගිල්ල (ප්‍රධාන ගොඩනැගිල්ල, ගරාජය,<br>මුරකුටිය, ජල ටැංකිය, ශීතාගාරය, හා බලාගාර ගොඩනැගිල්ල) | රු. 84,807,400.00 |
| එකතුව | රු.339,207,400.00 |

### 02.03 තොග

තොගය එහ පිරිවැය වටිනාකමට අගය කරනු ලබයි. කෙසේ වුවද පරිත්‍යාග ප්වාහි ඇස්තමේන්තුගත වටිනාකමට අගය කරනු ලබයි. ලැබේ යැයි ඇස්තමේන්තුගත වටිනාකමට ලැබීම්, පෙන්වා තිබේ.

### 02.04 ලැබීම්

ලැබීම් ලෙස අයවේ යැයි අපේක්ෂිත ද්‍රව්‍යවල වටිනාකම ලැබීම් යටතේ දක්වා ඇත.

### 02.05 ස්ථාවර වත්කම් තක්සේරු කිරීම

කාර්යල ලී බඩු හා උපකරණ, පුස්තකාල උපකරණ, පොත් බැඳුම් උපකරණ, ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ හා මෝටර් රථවල 2014.12.31 දිනට තක්සේරු කරන ලද වටිනාකමින් ප්වාහි එකිනෙක මිලදී ගැනීම් වටිනාකම අඩු කර සහ බැහැර කිරීම් වල වටිනාකම්වලට එකතු කර 2011.12.31 දිනට ස්ථාවර වත්කම් මිල අගය ගණනය කරන ලදී.

රු. 96512.16ක් වටිනා පුස්තකාල උපකරණ 2020.12.31 දිනට භෞතිකව නොපවතින බවට හඳුනාගෙන තිබේ. එලෙස භෞතිකව නොපවතින බැවින් වාර්ෂික ක්ෂයවීම් ගණනය කර නොමැත.

### 02.06 ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ප්‍රාග්ධන ප්‍රදානවලින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත කරන ලද සම්පූර්ණ වටිනාකම වර්ෂයේ සමුච්චිත අරමුදලට මාරු කර තිබේ.

### 02.07 ස්ථාවර වත්කම් බැහැර කිරීම / පරිත්‍යාග කිරීම

ඉවත් කළ / පරිත්‍යාග කළ හැකි ස්ථාවර වත්කම් ලෙස රු.2,640,900.00 ක අගයන් හඳුනාගෙන ඇති අතර එය එම වසර තුළ දී ඉවත් කොට ඇත.

### 03 <u>වගකීම් හා වෙන්කිරීම්</u>

**03.01** මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක් ඇතුළත දී ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම්, ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ වර්ග කර තිබේ.

මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක ඉක්ම ගිය පසු ගෙවිය යුතු ගෙවීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර තිබේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන දිනට හෙළිදරව් වූ සියලු වගකීම් ගිණුම් ගත කර තිබේ.

### 03.02 විශ්‍රාමික ප්‍රතිලාභ

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මණ්ඩලයේ සේවකයින් සඳහා විශ්‍රාමික පාරිතෝෂික වෙන් කිරීම් කර තිබේ. කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුකූලව වසර 05ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පමණක් විශ්‍රාමික පාරිතෝෂික ගෙවිය යුතු වේ. මෙම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

**03.03 හඳුනාගත් සේවක දායකත්ව සැලැස්ම - සේ.අ.අ. සහ සේ.භා.අ.**

මණ්ඩලයේ සියලුම සේවකයින් සේ.අ.අ. සහ සේ.භා.අ. දායකත්ව මුදල් යැවීමට සුදුසුවන අනුරූපීව අතර ව්‍යවස්ථාපිත නීතිරීතිවලට අනුව ඒ සඳහා මණ්ඩලයෙන් 12%ක් හා 3%ක් වශයෙන් දායකත්ව දරනු ලැබේ.

**03.04 මෙහෙයුම් කල්බදු යටතේ වාහන කුලියට ගැනීම**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෑන් රථයක් සහ කැබ් රථයක් මෙහෙයුම් කල්බදු යටතේ අත්පත් කරගෙන ඇත. 2018 සැප්තැම්බර් මස 05 වන දින සිට ගිවිසුම්ගත වී ඇති අතර එය මාස 60 කින් අවසන් වේ. මණ්ඩලය මේ සඳහා මාසිකව රු.169,369/- බදු, සහ රු.164,300/- බදු, ලෙස අනුරූපීව කල්බදු වාරික ගෙවනු ලබයි.

මෙහෙයුම් කල්බදු වගකීම පහත පරිදි වේ. (බදු සමග)

| | |
|---|---|
| 2021 (ජංගම වගකීම්) | රු. 4,324,000/- |
| 2022-2023(ජංගම නොවන වගකීම්) | රු. 7,640,000/- |

**04 <u>මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය</u>**

**04.01 ආදායම්**

අ) මණ්ඩලයේ ඉපැයීම් යටතේ ශ්‍රවණාගාර කුලී ආදායම, අලෙවිහලේ ආදායම, පොලී ආදායම, සහ විවිධ ආදායම් ලෙස හඳුනා ගැනේ.
ආ) සියලු ආදායම් උපචිත පදනමින් හඳුනාගෙන තිබේ.
ඇ) 2020 වසර සඳහා රජයේ ප්‍රදාන වශයෙන් පුනරාවර්තන ආධාර රු. 144,300,000.00 ක් හා ප්‍රාග්ධන ආධාර රු. 6,405,000.00 ක් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා ලැබී තිබේ.

**04.02 ආදායම් හඳුනාගැනීම**

අ) ඉහත උපචිත පදනම මත ලද ආදායම්, අදාළ වියදම් හා ගළපා ඇත.
ආ) පොලී ආදායම කාල පදනම මත උපචිත කර තිබේ.
ඇ) විදේශීය ප්‍රධාන විලම්භිත ආදායමක් ලෙස සලකන ලද අතර දරන ලද සත්‍ය වියදම පදනම් කරගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගලපා තිබේ.

**04.03 වියදම්**

මණ්ඩලයේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් උපචිත පදනම මත ආදායමට එරෙහිව ගැලපීමෙන් පසු වර්ෂයේ අතිරික්තය/ හිඟය නිරූපණය කර තිබේ.

**05 <u>රජයේ ප්‍රදාන</u>** -

වර්ෂය තුළ ලද රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සන්සඳනාත්මක වටිනාකමකින් යුතුව අදාළ පිරිවැය හා සසදා ආදායම ලෙස හඳුනාගෙන තිබේ.

**06 <u>මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය</u>**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති /02, මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමවේදය අනුගමනය කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ.

**07 <u>මූල්‍ය තත්වයන් ඉදිරිපත් කරන දිනට පසුව සිදු වූ සිදුවීම්</u>**

මූල්‍ය තත්ව වාර්තා දිනට පසු සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අවශ්‍ය පරිදි සලකා බලා හෙළිදරව් කිරීම් සහ අදාළ පරිදි ගැලපීම් සිදු කර ඇත.

**08 <u>බැංකු ගිණුම්</u>**

මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් අස්තීත්වයන්ගෙන් ප්‍රාග්ධන ලැබීම් ගනුදෙනු සටහන් කිරීම සඳහා ජංගම ගිණුම් අංක 100113398963 දරන මහජන බැංකු ගිණුම් නඩත්තු කරනු ලබන අතර ආයතනයේ මෙහෙයුම් කටයුතු සටහන් කිරීම සඳහා අනෙක් ජංගම බැංකු ගිණුම් දෙක නඩත්තු කරනු ලබයි.

**09 <u>අමතර සටහන්</u>**

ජාතික පුස්තකාල ගොඩනැගිල්ල පසුගිය වසරේ සිට නවීකරණය කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 211ක බඳුවේ.

# මූල්‍ය විස්තර සටහන්

| | | 31.12.2020<br>රු. | 31.12.2019<br>රු. |
|---|---|---|---|
| **සටහන් 01 මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ගිණුම් අංකය 2323283 -ලංකා බැංකුව | | 7,535,967.00 | 3,385,131.00 |
| ගිණුම් අංකය 100113398963 -මහජන බැංකුව | | 888,096.00 | 3,641,271.00 |
| ගිණුම් අංකය 100163170315 -මහජන බැංකුව | | 5,175,152.00 | 3,520,663.00 |
| පොත් හුවමාරු සේවාව සඳහා තැන්පත් -ජා.ඉ.බැ | | 219,763.00 | 219,763.00 |
| | | **13,818,978.00** | **10,766,828.00** |
| **සටහන් 02 - ලැබිය යුතු දෑ** | | | |
| උත්සව අත්තිකාරම් | | 11,750.00 | 71,750.00 |
| ආපදා ණය | | 14,489,584.00 | 14,034,822.00 |
| විශේෂ අත්තිකාරම් | | 6,000.00 | 4,000.00 |
| සුළු මුදල් අග්‍රිමය | | 4,714.00 | 4,714.00 |
| විවිධ අත්තිකාරම් | | 341,622.00 | 286,722.00 |
| ලැබිය යුතු දෑ කාර්ය මණ්ඩලයෙන් | | - | 40,000.00 |
| | | **14,853,670.00** | **14,442,008.00** |
| **සටහන් 03 - තොගය** | | | |
| පොත් තොගය - ජාත්‍යන්තර පොත් හුවමාරු සේ-වාව | | 106,435.00 | 106,435.00 |
| | | 5,165,147.00 | 4,625,048.00 |
| පොත් තොගය - අලෙවිය සහ බෙදා හැරීම | | 5,231,161.00 | 4,606,132.00 |
| පොත් තොගය - සම්භාව්‍ය | | 552,783.00 | 1,271,600.00 |
| ලිපිද්‍රව්‍ය තොගය - පුස්තකාල | | 1,632,769.00 | 1,476,952.00 |
| ලිපිද්‍රව්‍ය තොගය -කාර්යාල | | 3,757,217.00 | 4,367,633.00 |
| පොත්හලේ වෙළඳ තොගය | | - | 170,677.00 |
| නොනිමි තොගය- - -පන්සිය පනස් ජාතකය | | **16,445,512.00** | **16,624,477.00** |
| **සටහන් 04 පූර්ව ගෙවීම්** | | | |
| අලුත්වැඩියා හා නඩත්තු --- කාර්යාල උපකරණ | | 622,040.00 | 387,309.00 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර | | 103,890.00 | 77,503.00 |
| රක්ෂණ හා බලපත්‍ර --- මෝටර් රථ | | 65,028.00 | 72,822.00 |
| රක්ෂණ - - දේපළ | | 96,277.00 | 104,600.00 |
| තොරතුරු තාක්ෂණ වියදම් | | 847,120.00 | - |
| පූර්ව ගෙවීම් -- වෙනත් | | - | 212,601.00 |
| | | **1,734,355.00** | **854,835.00** |
| **සටහන් 05 - තැන්පතු** | | | |
| ඉන්ධන සඳහා තැන්පතු | | 50,000.00 | 50,000.00 |
| සේවක ආරක්ෂක තැන්පතු - (ජා. ඉ. බැ.) | | 335,716.00 | 311,942.00 |
| | | **385,716.00** | **361,942.00** |
| **සටහන් 06 - යටිතල පහසුකම්, පිරියත හා උපකරණ** | | | |
| පුස්තකාල උපකරණ | 6.I | 26,206.00 | 26,206.00 |
| ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ | 6.II | 3,242.00 | 3,603.00 |
| පොත් බැඳුම් උපකරණ | 6.III | 4,828,511.00 | 5,365,013.00 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 6.IV | 20,142,523.00 | 19,450,056.00 |
| පරිගණක හා පරිගණක උපකරණ | 6.V | 9,109,592.00 | 9,774,154.00 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර | 6.VI | 2,193,879.00 | 2,647,759.00 |
| මෝටර් රථ | 6.VII | 15,189,569.00 | 16,877,299.00 |
| | | **51,493,522.00** | **54,144,090.00** |

**සටහන් 07 - ඉඩම හා ගොඩනැගිලි**

| | | | |
|---|---|---|---|
| ජාතික පුස්තකාල ගොඩනැගිල්ල | 7.I | 105,731,894.00 | 108,442,968.00 |
| ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල | 7.II | 426,583.00 | 437,521.00 |
| | | **106,158,477.00** | **108,880,489.00** |

**සටහන් 08 - වෙනත් මූල්‍ය නොවන වත්කම්**

| | | | |
|---|---|---|---|
| පොත් තොගය -- ජාතික පුස්තකාලය | 8.I | 30,994,504.00 | 33,892,847.00 |
| ජාතික පුස්තකාලය - **සංඛ්‍යාංක එකතුව** | 8.II | 7,967,138.00 | 8,852,375.00 |
| Kiyawamu.lk | 8.III | 2,276,165.00 | 2,529,072.00 |
| | | **41,237,807.00** | **45,274,294.00** |

**සටහන් 09 - ගෙවිය යුතු දෑ**

| | | |
|---|---|---|
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 309,500.00 | 378,000.00 |
| රඳවාගත් මුදල් | 548,461.00 | 3,582,977.00 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 21,725.00 | - |
| ගෙවිය යුතු බදු | - | 87,551.00 |
| ගෙවිය යුතු VAT | 15,192.00 | 249,056.00 |
| ගෙවිය යුතු WHT | 64,200.00 | 426,700.00 |
| වෙළඳ හිමියෝ | 644,882.00 | - |
| | **1,603,960.00** | **4,724,284.00** |

**සටහන් 10 - උපචිත වියදම්**

| | | |
|---|---|---|
| අතිකාල හා නිවාඩු ගෙවීම් | 66,016.00 | 250,052.00 |
| ශ්‍රවණාගාර දීමනා | 1,200.00 | 5,600.00 |
| සංග්‍රහ වියදම් | 79,480.00 | 42,750.00 |
| සේවක ගමන් වියදම් (දේශීය) | 12,615.00 | 8,470.00 |
| සුබසාධන වියදම් | 7,130.00 | 123,347.00 |
| විශේෂ කමිටු ගාස්තු | 1,000.00 | - |
| කාර්යාලයීය ලිපිද්‍රව්‍ය | 1,875.00 | - |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 24,040.00 | 49,760.00 |
| සනීපාරක්ෂක වියදම් | 286,070.00 | 271,205.00 |
| දුරකථන | 160,010.00 | 87,016.00 |
| විදුලිය | 814,119.00 | 1,179,206.00 |
| ජලය | 30,038.00 | 46,909.00 |
| තැපැල් ගාස්තු | 18,000.00 | - |
| තොරතුරු තාක්ෂණ (අන්තර්ජාල ගාස්තු) | 17,353.00 | 18,024.00 |
| ආරක්ෂක වියදම් | 323,720.00 | 324,772.00 |
| අලුත් වැඩියාව හා නඩත්තුව -- කාර්යාල උපක- | 6,000.00 | 143,570.00 |
| රණ | - | 6,000.00 |
| අලුත් වැඩියාව සහ නඩත්තු -- මණ්ඩලයීය පරිශ්‍රය | 6,394.00 | - |
| දැන්වීම් ගාස්තු | 1,500.00 | - |
| පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා | - | 2,040.00 |
| ජාතික කියවීමේ මාසයේ වියදම් | 75,852.00 | 16,112.00 |
| නව ප්‍රකාශන මිලදී ගැනීමේ වියදම් | 675,270.00 | - |
| සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන වියදම් | - | 527,755.00 |
| ග්‍රාමීය ප්‍රජා පුස්තකාල සංවර්ධනය | - | 1,207,724.00 |
| පොත් තොගය- - ජාතික පුස්තකාලය | - | 796,950.00 |
| පුස්තකාල ලිපි ද්‍රව්‍ය තොගය | 39,894.00 | - |
| ඡායාරූප සේවාව | - | 14,000.00 |
| වෙනත් උපචිත වියදම් | 2,915,550.00 | 4,460,450.00 |
| විගණන ගාස්තු | **5,563,126.00** | **9,581,712.00** |

**සටහන් 11 - සේවක ප්‍රතිලාභ**

| | | |
|---|---|---|
| සේවක ආරක්ෂක තැන්පතු | 189,253.00 | 175,253.00 |
| සේවක ආරක්ෂක තැන්පතු පොළිය | 151,463.00 | 139,689.00 |
| | **340,716.00** | **314,942.00** |

**සටහන් 12 - වෙනත් ජංගම වගකීම්**

| | | |
|---|---|---|
| වෙනත් ආයතනවලින් ආපසු ගෙවිය යුතු වියදම් | - | (234,760.00) |
| සාමාන්‍ය ණය හිමියන් | 989,372.00 | 989,372.00 |
| පොදු රාජ්‍ය මණ්ඩලයීය ඉගෙනුම් ව්‍යාපෘතිය | 532,480.00 | - |
| | **1,521,852.00** | **754,612.00** |

**සටහන් 13 - ප්‍රාග්ධන / වෙනත් ආයතනවලින් ලද ප්‍රදාන**

| | | |
|---|---|---|
| ප්‍රදාන හා පරිත්‍යාග ගිණුම | 7,030.00 | 7,030.00 |
| ශේෂය ඉ / ගෙ | - | - |
| **එකතු කළා - වෙනත් අස්තිත්වයන්ගෙන් ලද ප්‍රාග්ධනය** | 7,030.00 | 7,030.00 |
| වර්ෂය තුළ ගැලපීම් | - | - |
| | **7,030.00** | **7,030.00** |

**සටහන් 14 - සංචිත**

| | | |
|---|---|---|
| **ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන** | | |
| ශේෂය ඉ / ගෙ | 959,147.00 | 2,881,696.00 |
| ගැලපීම් | - | - |
| | 959,147.00 | 2,881,696.00 |
| එකතු කළා - භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන | 6,405,000.00 | 13,250,000.00 |
| | 7,364,147.00 | 16,131,696.00 |
| අඩු කළා - ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම් | (4,225,513.00) | (13,010,272.00) |
| ප්‍රාග්ධන ස්වරූපයේ පුනරාවර්තන වියදම් | - | (2,162,277.00) |
| | **3,138,634.00** | **959,147.00** |

**සටහන් 15 - සමුච්චිත අරමුදල**

| | | |
|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 196,031,572.00 | 194,486,401.00 |
| වර්ෂයේ ගැලපීම් | 80,364.00 | - |
| | 196,111,936.00 | 194,486,401.00 |
| එකතු කිරීම් / අඩු කිරීම් | | |
| වියදම් ඉක්ම වූ ආදායම් වල එකතුව | (11,963,702.00) | (11,465,100.00) |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් ගැනීම් | 4,225,513.00 | 13,010,272.00 |
| | **188,373,747.00** | **196,031,573.00** |

**සටහන් 16 - පොත් අලෙවිහලේ වෙළඳ ගිණුම**

| | | |
|---|---|---|
| පුස්තකාල ලිපිද්‍රව්‍ය අලෙවිය | 868,056.00 | 1,315,345.00 |
| බැදුම් ද්‍රව්‍ය අලෙවිය | 357,825.00 | 98,690.00 |
| පොත් --- ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය | 128,728.00 | (399,215.00) |
| දුම්මල තෙල් අලෙවිය | 32,500.00 | 12,500.00 |
| කාර්යාල උපකරණ අලෙවිය | 27,349.00 | 135,125.00 |
| පොත් අලෙවි හලේ වෙළඳ ගිණුම - | (610,416.00) | 1,592,640.00 |
| | **804,042.00** | **2,755,085.00** |

**සටහන් 17 - අය කිරීම්, දඩ හා අයභාර**

| | | |
|---|---|---|
| අත්පිටපත් සමීක්ෂණයට ලද ගාස්තු | 14,016.00 | 156,172.00 |
| පාඨකයන් ලියාපදිංචි කිරීමෙන් ලද ගාස්තු | 254,155.00 | 366,592.00 |
| ISBN ව්‍යාපෘතියෙන් ලද ගාස්තු | 905,232.00 | 1,295,868.00 |
| පුස්තකාල සේවා මගින් ලද ගාස්තු | 1,137,110.00 | 1,187,433.00 |
| | **2,310,513.00** | **3,006,065.00** |

**සටහන් 18 - පොළී ආදායම**

| | | |
|---|---|---|
| ආපදා ණය | 498,303.00 | 548,156.00 |
| විශේෂ අත්තිකාරම් | 4,154.00 | 6,137.00 |
| වෙනත් පොළී | - | 3,250.00 |
| | **502,457.00** | **557,543.00** |

**සටහන් 19 - ප්‍රකාශන බෙදා හැරීම ආදායම**

| | | |
|---|---|---|
| ජාතික ග්‍රන්ථ නාමාවලියේ අලෙවිය | 164,295.00 | 361,491.00 |
| මණ්ඩලයීය ප්‍රකාශන අලෙවිය | 276,113.00 | 554,996.00 |
| | **440,408.00** | **916,487.00** |

**සටහන් 20 - වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| ඡායාපිටපත් ගාස්තු | 144,389.00 | 144,514.00 |
| ටෙන්ඩර් අයදුම්පත් අලෙවිය | 176,762.00 | 52,500.00 |
| ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අයදුම්පත් ගාස්තු | 30,950.00 | 21,900.00 |
| පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ ලැබීම් | 109,200.00 | 153,500.00 |
| ලැබීම් | - | 50,000.00 |
| භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ අලෙවි ආදායම | 185,265.00 | 923,675.00 |
| විවිධ ආදායම් | 244,924.00 | 426,138.00 |
| | **891,490.00** | **1,772,227.00** |

**සටහන් 21 - පුස්තකාල සේවා වියදම්**

| | | |
|---|---|---|
| සාමාජික ගාස්තු- - ජාත්‍යන්තර පුස්තකාල | 128,044.00 | 180,342.00 |
| ජාත්‍යන්තර හුවමාරු සේවය | 11,175.00 | 27,461.00 |
| ප්‍රතිග්‍රහණ වියදම් | 7,330.00 | 35,712.00 |
| පාඨක අධ්‍යාපන හා ප්‍රචාරක වියදම් | 214,472.00 | 425,400.00 |
| ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම | 145,371.00 | 540,453.00 |
| පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා | 34,862.00 | 183,489.00 |
| පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම | 2,273,808.00 | 2,023,052.00 |
| ජාතික කියවීමේ මාසයේ වියදම් | 229,960.00 | 1,437,659.00 |
| ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය | 97,998.00 | 37,165.00 |
| පුස්තකාල විශේෂ දින සැමරීම | 185,630.00 | 297,409.00 |
| තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වියදම් | 219,684.00 | 70,426.00 |
| අන්තර්ජාල වියදම් | 146,616.00 | 234,276.00 |
| ද්‍රව්‍ය සංඛ්‍යාංකකරණය පුස්තකාල වියදම් | 28,698.00 | 6,000.00 |
| පුස්තකාල අධ්‍යාපන සම්මන්ත්‍රණ | 144,616.00 | 924,370.00 |
| සම්මන්ත්‍රණ, දේශන හා පුහුණු වැඩමුළු | 86,340.00 | 279,843.00 |
| විශේෂ පාඨමාලා සඳහා ගාස්තු | 77,840.00 | 215,758.00 |
| පොදු රාජ්‍ය මණ්ඩලයීය අධ්‍යාපන ව්‍යාපෘති වියදම් | 153,560.00 | - |
| අත්පිටපත් සමීක්ෂණ ගාස්තු | 393,610.00 | 312,281.00 |
| සම්භාව්‍ය කෘති සංස්කරණය සහ ප්‍රකාශනය | - | 689,627.00 |
| පුස්තකාල සාහිත්‍ය හා ප්‍රකාශන වියදම් | 94,335.00 | 474,293.00 |
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක | 270,183.00 | 382,183.00 |
| පොත් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපනය කිරීම | 2,208,516.00 | 1,572,441.00 |
| පුස්තකාල පර්යේෂණ වියදම් | 156,688.00 | 612,019.00 |
| පුස්තකාල සහයෝගීතා වියදම් | 13,121.00 | 162,165.00 |
| කාර්යාල කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම් | - | 450,700.00 |
| ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය | - | 1,711,577.00 |
| | **7,322,457.00** | **13,286,101.00** |

**සටහන් 22 -පරිපාලන හා ආයතනික වියදම්**

| | | | |
|---|---|---|---|
| සේවක වැටුප්, වේතන හා සේවක දීමනා | 22.1 | 105,169,892.00 | 96,985,444.00 |
| සැපයීම් හා උපයෝජන භාවිතය | 22.2 | 29,445,032.00 | 32,762,865.00 |
| අලුත් වැඩියා හා නඩත්තු ප්‍රාග්ධන වත්කම් වියදම් | 22.3 | 5,387,787.00 | 4,885,568.00 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 22.4 | 12,787,062.00 | 12,865,617.00 |
| වෙනත් වියදම් | 22.5 | 1,168,620.00 | 1,084,682.00 |
| | | **153,958,393.00** | **148,584,176.00** |

**සටහන් 23 - මූල්‍ය වියදම්**

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 20,410.00 | 33,112.00 |
| | **20,410.00** | **33,112.00** |

මූල්‍ය විස්තර සටහන්

සටහන් 6, 7, 8 - 2020 දෙසැම්බර් 31 දිනට පිරියත දේපළ හා උපකරණ

| සටහන් | විස්තරය | ක්ෂය වීම් අගය (%) | 2020.01.01 දිනට වටිනාකම | එකතු කිරීම් | ඉවත් කිරීම් | මුළු පිරිවැය | 2020.01.01 දිනට සමුච්චිත ක්ෂය | එකතු කිරීම් ඉවත් කිරීම් | 2020 වසර සඳහා ක්ෂය | මුළු ක්ෂය | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.I | පුස්තකාල උපකරණ | 10% | 96,512.16 | - | - | 96,512.16 | 70,305.92 | - | - | 70,305.92 | 26,206.24 |
| 6.II | ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ | 10% | 46,874.00 | - | - | 46,874.00 | 43,271.40 | - | 360.26 | 43,631.66 | 3,242.34 |
| 6.III | පොත් බැඳුම් උපකරණ | 10% | 9,122,007.00 | - | - | 9,122,007.00 | 3,756,994.47 | - | 536,501.25 | 4,293,495.72 | 4,828,511.28 |
| 6.IV | කාර්යාල ලී බඩු හා උපකරණ | 10% | 39,430,324.60 | 2,885,830.00 | (287,562.06) | 42,028,592.54 | 19,978,239.20 | (198,916.62) | 2,106,747.33 | 21,886,069.91 | 20,142,522.63 |
| 6.V | පරිගණක හා පරිගණක උපාංග | 10% | 18,531,092.68 | 895,000.00 | (1,392,400.00) | 18,033,692.68 | 8,756,938.52 | (763,278.78) | 930,441.65 | 8,924,101.39 | 9,109,591.29 |
| 6.VI | පිරියත හා යන්ත්‍රසූත්‍ර | 10% | 7,120,653.72 | - | (960,946.00) | 6,159,707.72 | 4,472,894.71 | (750,830.37) | 243,764.34 | 3,965,828.68 | 2,193,879.04 |
| 6.VII | මෝටර් රථ | 10% | 32,270,761.74 | - | - | 32,270,761.74 | 15,393,463.19 | - | 1,687,729.86 | 17,081,193.05 | 15,189,568.70 |
| 7.I | ජාතික පුස්තකාල ගොඩනැගිල්ල | 2.5% | 144,437,913.56 | - | - | 144,437,913.56 | 35,994,945.53 | - | 2,711,074.20 | 38,706,019.73 | 105,731,893.83 |
| 7.II | ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල | 2.5% | 803,320.09 | - | - | 803,320.09 | 365,798.58 | - | 10,938.04 | 376,736.62 | 426,583.47 |
| 8.I | ජාතික පුස්තකාලයේ පොත් තොගය | 10% | 111,916,057.41 | 444,682.75 | - | 112,360,740.16 | 77,944,876.05 | - | 3,421,360.36 | 81,366,236.41 | 30,994,503.75 |
| 8.II | ජාතික පුස්තකාල - සංඛ්‍යාංක එකතුව | 10% | 10,376,611.65 | - | - | 10,376,611.65 | 1,524,236.65 | - | 885,237.50 | 2,409,474.15 | 7,967,137.50 |
| 8.III | Kiyawamu.lk | 10% | 2,726,001.60 | - | - | 2,726,001.60 | 196,929.56 | - | 252,907.20 | 449,836.76 | 2,276,164.84 |
| | එකතුව | | **376,878,130.21** | **4,225,512.75** | **(2,640,908.06)** | **378,462,734.90** | **168,498,893.78** | **(1,713,025.77)** | **12,787,061.99** | **179,572,930.00** | **198,889,804.90** |

**විශේෂ සටහන්**

6.I. පුස්තකාල උපකරණවල වටිනාකමට අදාළ වත්කම්, සත්‍යාපනය තුළින් හඳුනාගැනීමට නොහැකි වූ බැවින් වාර්ෂික ක්ෂය වෙන්කර නොමැත

**සටහන් 22.1 - වැටුප් වේතන හා සේවක දීමනා**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 83,120,976.00 | 73,976,599.00 |
| සේ. අ. අ. | 9,250,274.00 | 8,316,789.00 |
| සේ. භා. අ. | 2,312,569.00 | 2,079,197.00 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 904,910.00 | 2,348,969.00 |
| පාරිතෝෂික | 7,383,974.00 | 6,830,283.00 |
| මණ්ඩලයීය සාමාජික පාරිශ්‍රමිකය | 782,000.00 | 1,182,400.00 |
| කමිටු සාමාජික පාරිශ්‍රමිකය | 192,800.00 | 246,100.00 |
| ශ්‍රවණාගාරයේ වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම් | 53,000.00 | 45,100.00 |
| ගමන් වියදම් | 96,243.00 | 297,424.00 |
| විදේශ ගමන් හා අධ්‍යාපනික වැඩසටහන් | 30,398.00 | 292,211.00 |
| සේවක නිල ඇඳුම් | 24,000.00 | 45,750.00 |
| වෛද්‍ය පර්යේෂණ ගාස්තු | 1,750.00 | 24,500.00 |
| සුබසාධන වියදම් | 344,133.00 | 380,099.00 |
| සංග්‍රහ වියදම් | 124,582.00 | 207,240.00 |
| සහනදායි දුම්රිය ප්‍රවේශ පත්‍ර | 547,583.00 | 610,477.00 |
| තරඟ විභාග ගාස්තු | 700.00 | 102,306.00 |
| | **105,169,892.00** | **96,985,444.00** |

**සටහන් 22.2 - සැපයීම් හා උපයෝජන වියදම්**

| | | |
|---|---|---|
| කාර්යාල ලිපිද්‍රව්‍ය | 1,568,354.00 | 2,202,174.00 |
| මණ්ඩලයීය දේපල රක්ෂණය | 136,692.00 | 144,972.00 |
| වාහන රක්ෂණය | 441,400.00 | 498,095.00 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් වියදම් | 693,348.00 | 1,305,695.00 |
| දුරකථන වියදම් | 2,091,629.00 | 1,829,803.00 |
| විදුලිය සඳහා වියදම් | 11,615,049.00 | 11,658,894.00 |
| ජල බිල්පත් වියදම් | 599,303.00 | 527,895.00 |
| ආරක්ෂක වියදම් | 3,718,470.00 | 4,161,542.00 |
| සනීපාරක්ෂක වියදම් | 3,107,318.00 | 3,078,825.00 |
| මෙහෙයුම් කල්බදු වාරික | 4,284,288.00 | 4,896,942.00 |
| මුද්‍රණ වියදම් | 186,828.00 | 40,044.00 |
| පුවත්පත් හා ප්‍රකාශන | 196,500.00 | 196,060.00 |
| දැන්වීම් සඳහා වියදම් | 181,204.00 | 1,259,834.00 |
| තැපැල් ගාස්තු | 402,847.00 | 476,873.00 |
| කුවිතාන්සි වෙනුවෙන් මුද්දර ගාස්තු | - | 1,650.00 |
| සැලසුම් පිළියෙල කිරීමේ හා පරිවර්තන වියදම් | 219,302.00 | 423,567.00 |
| විශේෂ කමිටු රැස්වීම් | 2,500.00 | 60,000.00 |
| | **29,445,032.00** | **32,762,865.00** |

**සටහන් 22.3 - ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු**

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල නඩත්තුව | 2,448,433.00 | 680,836.00 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 2,164,406.00 | 2,412,761.00 |
| මණ්ඩලයීය භූමිය නඩත්තුව | 223,980.00 | 350,851.00 |
| මෝටර් රථ නඩත්තුව | 550,968.00 | 1,441,120.00 |
| | **5,387,787.00** | **4,885,568.00** |

**සටහන් 22.4 - ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්**

| | | |
|---|---|---|
| ක්ෂයවීම් | 12,787,062.00 | 12,865,617.00 |
| | **12,787,062.00** | **12,865,617.00** |

| **සටහන් 22.5 - වෙනත් වියදම්** | | |
|---|---|---|
| විගණන ගාස්තු | 975,000.00 | 975,000.00 |
| නීති ගාස්තු | 188,156.00 | 92,940.00 |
| විවිධ වියදම් | 5,464.00 | 16,742.00 |
| | **1,168,620.00** | **1,084,682.00** |

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත කිරීම් හා තත්‍ය වියදම් විස්තරය

| විස්තරය | අනුමත සංශෝධිත අයවැය | තත්‍ය වියදම් | විචලනය | හේතුව |
|---|---|---|---|---|
| **පුනරාවර්තන** | | | | |
| වැටුප් හා වේතන | 105,465,000.00 | 105,019,008.00 | 445,992.00 | වැටුප් හා වේතන සඳහා සත්‍ය වියදම සහ ප්‍රතිපාදන ලැබීම් |
| ගමන් වියදම් | 261,000.00 | 127,000.00 | 134,000.00 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන් |
| සැපයීම් හා පාරිභෝජන | 4,104,000.00 | 2,285,000.00 | 1,819,000.00 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන් |
| නඩත්තු වියදම් | 5,308,000.00 | 5,387,000.00 | (79,000.00) | මධ්‍යස්ථයි (විචලනය 1.41ටත් වඩා අඩුය) |
| වෙනත් සේවා | 29,984,000.00 | 28,372,000.00 | 1,612,000.00 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇතිවූ අවිනිශ්චිත තත්ත්වයන් |
| පුස්තකාල සේවා | 7,911,000.00 | 7,323,000.00 | 588,000.00 | ප්‍රශස්ථ මට්ටමකි. කොවිඩ් 19 වසංගත තත්ත්වයේ වූවද 93%ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| | **153,033,000.00** | **148,513,008.00** | **4,519,992.00** | |
| **ප්‍රාග්ධන** | | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 5,750,000.00 | 3,781,000.00 | 1,969,000.00 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇති වූ අවිනිශ්චිත තත්ත්-වයන් නිසා වර්ෂය තුළදී වැඩිදුරටත් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම |
| පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම | 1,750,00.00 | 445,000.00 | 1,305,000.00 | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇති වූ අවිනිශ්චිත තත්ත්-වයන් නිසා වර්ෂය තුළදී වැඩිදුරටත් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම |
| | **7,500,000.00** | **4,226,000.00** | **3,274,000.00** | |

# විගණන වාර්තා - 2020

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } HED/F/1/NLDSB/2020/FA/04 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 අගෝස්තු 29 දි

05 SEP 2023

සභාපති,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය.
2. ලේකම් , මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/NLDSB/2020/FA/04 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 අගෝස්තු 29 දින

සභාපති,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1998 අංක 51 දරන නව සංශෝධිත පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික ප්‍රලේඛන සම්පත් සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නිත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණු එකතුව රු.112,360,740 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධව ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) 2015 ජුලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ කාර්යාලීය ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් මණ්ඩලයට පවරා දී තිබුණද එම ඉඩම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී බැංකුව වෙත ලැබී තිබූ එකතුව රු.261,028 ක සෘජු බැර කිරීම්වලට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ රු.219,763 ක් වූ ශේෂය සනාථ කර ගැනීම සඳහා බැංකු පාස්පොත හෝ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2020 දෙසැම්බර් 31 දිනට පුස්තකාල ලිපිද්‍රව්‍ය තොගයේ හා සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය කිරීමේ ව්‍යාපෘති පොත් තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන හා ගබඩා තොග සමීක්ෂණ වාර්තා සමඟ සැසඳීමේදී රු.1,045,012 ක වෙනසක් පැවතුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව පොත් තොගයේ පිරිවැය රු.112,360,740 ක් වුවද පරිග්‍රහණ ලේඛනය අනුව පොත් තොගයේ පිරිවැය රු.45,805,329 ක් වූයෙන් රු.66,564,411ක වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) තෑගි ඔප්පුවක් මඟින් බණ්ඩාරගම පිහිටි පර්චස් 12 ක ඉඩම හා ඉඩමේ පිහිටි මහල් දෙකකින් යුත් ගෘහ භාණ්ඩ සහිත නිවස 2019 ජුලි 19 වන දින මණ්ඩලය වෙත පවරා දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස්

කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

5

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ),(ඇ),(ඉ) හා (ඊ) යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| <u>නීතිරීති/ විධානයට යොමුව</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|
| (අ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | |
| (i) 12(2) (අ) හා (ආ) වගන්ති | පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳව ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම,වැඩිදියුණු කිරීම, පවත්වාගෙනයාම හා සංරක්ෂණය සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන, ප්‍රතිග්‍රහණ හා ග්‍රන්ථ විඥාපන පාලන අංශවල ප්‍රගතිය වාර්තාවලින් පිළිබිඹු වී නොතිබුණු අතර එම අංශවල පිළිවෙලින් ඒකක 33,353 ක්, 9,210 ක්, හා 4,743 ක් අතරැදී තිබුණි. |

| | |
|---|---|
| (ii) 12(2) (උ) වගන්තිය | ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්කළ යුතු කාලවකවානුව නියම කර නොතිබුණු අතර 2019,2020 හා 2021 වර්ෂවල ප්‍රමාද වී ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මාස 28 ක් ප්‍රමාද වී 2023 ජුනි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.378,462,735 ක් වූ දේපල, පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසිය 371 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 (ආ) ඡේදය | කාර්යය නිමකල විගස තත්කාර්යය අතුරු අග්‍රිම පියවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 සිට වර්ෂ 09ත් අතර කාලයක සිට පැවතෙන රු.341,622 ක් වූ අග්‍රිම ශේෂ 17 ක් පැවතුණි. |
| (ii) මුදල් රෙගුලාසිය 756, 757 | 2020 දෙසැම්බර් 31 දිනට මිලදීගෙන තිබුණු පිරිවැය රු.112,360,740 ක් වූ පොත් තොගය සහ සංරක්ෂිත පොත් තොගය සමාලෝචිත වර්ෂයේදී ද සමීක්ෂණය කර නොතිබුණි. |
| (iii) මුදල්රෙගුලාසි 1647 (ආ) | මණ්ඩලය සතු පිරිවැය රු.32,270,762 ක් වූ වාහන 07 ක් හා මූල්‍ය කල්බදු වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඉ) 2020 අගෝස්තු 14 දිනැති අංක SC&PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු | විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගත යුතු වුවද 2020 දෙසැම්බර් 16 දින රු.686,040 |

වක්‍රලේඛය | ක් කැනඩාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සංවිධානය විසින් Skill online learning ව්‍යාපෘතිය යටතේ මණ්ඩලයේ බැංකු ගිණුමට සෘජුවම බැර කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කල රු.2,084,167 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 7,193 ක් 2023 ජුලි 18 දිනවන විටත් බෙදා හැර නොතිබුණි.

(ආ) 2018 ජනවාරි 24 දින සිට මාස 09 ක කාලයකින් ප්‍රධාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම නිම කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.211,937,795 ක් වූ බදු රහිත කොන්ත්‍රාත්තුවක් කොන්ත්‍රාත් සමාගමකට ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.252,463,612 ක් ගෙවා අවස්ථා 03 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගෙන තිබුණද 2021 මාර්තු කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි. 2021 ජනවාරි 05 දිනැති අංක 15-02-07 දරන සභාපතිගේ ලිපිය අනුව බිම් මහලේ සිට සිව්වන මහල දක්වා අසම්පූර්ණ හා නියමිත පරිදි නිම නොකළ කොන්ත්‍රාත් කාර්යයන් හඳුනාගෙන තිබුණු නමුත් 2022 නොවැම්බර් 09 දින වන විටත් එම අඩුපාඩු සම්පූර්ණ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති